සියලු ම හිමිකම් ඇවිරිණි/அனைத்து உரிமைகளும்/All Right Reserved

WWW.QUESTIONBANK.LK

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

**ගිණුම්කරණය** | 33 S I | පැය දෙකයි

**උපදෙස්:**

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමි වේ.
* විභාග අංකය ඉහලින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
* වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණන යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

විභාග අංකය :.............................................................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 1 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

---

**(1)** වර්තමාන හා අනාගත ආයෝජකයන්, සේවකයින්, ණය දෙන්නන්, ගැනුම්කරුවන්, රජය, මහජනයා මූල්‍ය ප්‍රකාශන ප්‍රයෝජනයට ගන්නන් ට ඇතුළත් ය. මෙයින් එක් එක් පාර්ශවයට ව්‍යාපාරයට සම්බන්ධ එකිනෙකට වෙනස් තොරතුරු අවශ්‍යතාවක් ඇත.
ආයෝජකයෙකුට අවශ්‍ය තොරතුරු ලෙස සැලකිය හැක්කේ මේවායින් කුමක්ද?

A. ව්‍යවසායක ආයෝජනය කළ යුතුද? ආයෝජන විකිණිය යුතුද? නැතහොත් එය තවදුරටත් රඳවා ගත යුතුද? තීරණය කිරීමට අවශ්‍ය තොරතුරු
B. ව්‍යවසායට සිය වගකීම් නිරාකරණය කිරීමට ඇති හැකියාව ප්‍රමාණවත් දැයි තීරණය කිරීමට අවශ්‍ය තොරතුරු
C. ලාභාංශ ගෙවීමට ව්‍යවසාය ට හැකියාවක් ඇත්දැයි තීරණය කිරීමට අවශ්‍ය තොරතුරු
D. දිගටම භාණ්ඩ හා සේවාවන් සැපයීමට ව්‍යවසායට ඇති හැකියාව පිළිබඳ තොරතුරු

1) A හා C ප්‍රකාශ
2) A හා B ප්‍රකාශ
3) B හා C ප්‍රකාශ
4) A හා D ප්‍රකාශ
5) B හා D ප්‍රකාශ

**(2)** සීමිත වීරසේකර සහ සමාගමට 2024 අප්‍රේල් 5 දින තෙක් භෞතික තොග ගණනය කිරීමට නොහැකි විය. එබැවින් 2024.03.31 දිනට තම අවසාන ගිණුම්වල දැක්විය යුතු තොගය ඇස්තමේන්තු කිරීම සඳහා ඔබගේ සහාය අපේක්ෂා කරයි. 2024 අප්‍රේල් 5 දිනට තොගයේ වටිනාකම පිරිවැයට රු. 565,000 ක් බවට තීරණය කර ඇත.

**අතිරේක තොරතුරු**

- දළ ලාභ අනුපාතය පිරිවැයට 25% වේ.
- 2024.04.01 දින සිට 2024.04.05 දින දක්වා කාලය තුල විකුණුම් රු. 125,000 ක් වේ. මෙයින් රු. 5,000 කට විකුණන ලද භාණ්ඩ 2024.04.07 දින දක්වා ඉවත් කරගෙන නොතිබුණි.
- 2024.04.01 දින සිට 2024.04.05 කාලය තුළ ගැණුම් රු. 84,000 ක් වේ. මෙයින් රු. 17,000 ක් පිරිවැය වන භාණ්ඩ 2024.04.08 දින දක්වා ව්‍යාපාරයට ලැබී නොතිබුණි.

අවසන් ගිණුම්වල දැක්විය යුතු තොග ශේෂය වන්නේ,

1) රු. 665,000
2) රු.656,000
3) රු.581,000
4) රු. 518,000
5) රු. 594,000

**(3)** අසම්පූර්ණ වාර්තා තබාගන්නා Enrich Business School ව්‍යාපාරයට අදාලව පහත තොරතුරු ඔබට ලබා දී ඇත.

- 2024.03.31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 242,000
- 2023/2024 වර්ෂයේ ණයගැති ලැබීම් රු. 1,300,000
- 2023.03.31 දිනට ණයගැති ශේෂය රු. 712,000
- 2023.03.31 දිනට ණයගැ ති ශේෂය රු. 630,000

2023/2024 වර්ෂයේ රු. 28,000 ක තොග කපාහැරීමේ අලාභයක් වාර්තා කර ඇත. ව්‍යාපාරයේ අවසාන තොගය ආරම්භක තොගය මෙන් 2/3 කි. දළ ලාභ අනුපාතය විකුණුම් පිරිවැයෙන් 20% කි. සියළුම ගැනුම් සියළුම විකුනුම් ණය පදනමට සිදුවුවා යැයි උපකල්පනය කළ විට 2023/2024 වර්ෂයේ ගැනුම් කොපමණද?

1) රු. 1,015,000
2) රු. 1,150,000
3) රු. 270,000
4) රු. 1,218,000
5) රු. 880,000

**(4)** ACCA සමාගම සෑම වර්ෂයකම වෙලඳ ලැබිය යුතු දෑ මත හානි කරණ අලාභ සඳහා වෙලඳ ලැබිය යුතු දෑ මත 2% ක් වෙන් කරනු ලබයි.මෙම වෙන් කිරීමට අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) උපචිත
2) අනාවරණ
3) ගැළපුම්
4) සංගතතා
5) විචක්ෂණ

**(5)** Enrich Business School සමාගම 2024.03.01 දින රු. 500,000 ක් වටිනා ඉඩමක් රු. 100,000 ක මූලික තැන්පතුවක් ගෙවීමෙන් අනතුරුව කල්බදු ක්‍රමයට මිලදී ගන්නා ලදි.මෙම කල්බද්ද මාස 60 කින් මසකට රු. 10,000 බැගින් ගෙවා අවසන් කල යුතුය.වාර්ෂික කල්බදු පොලී අනුපාතය 12% කි.
2024.03.31 දිනට මෙම ගනුදෙනු වල ශුද්ධ බලපෑම පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්නුම් කරනු ලබයි ද?

| | **වත්කම්** | **=** | **වගකීම්** | **+** | **හිමිකම** |
|---|---|---|---|---|---|
| 1) | 390,000 | = | 394,000 | + | (4,000) |
| 2) | 500,000 | = | 400,000 | + | 100,000 |
| 3) | 390,000 | = | 390,000 | + | - |
| 4) | 400,000 | = | 380,000 | + | 20,000 |
| 5) | 388,000 | = | 394,000 | + | (6,000) |

**(6)** ACCA සමාගම විසින් Enrich Business School සමාගමට භාණ්ඩ තොගයක් ණයට විකුණන ලදී. එම භාණ්ඩවලින් කොටසක් Enrich Business School සමාගම ඉල්ලුම් කරන ලද අවශ්‍යතා සමඟ නොගැලපෙන බැවින් නැවත ACCA සමාගම වෙත ආපසු එවන ලද අතර ACCA සමාගම ආපසු එවීම පිළිගන්නා ලදී. වෙළඳ ණය පියවීම සඳහා Enrich Business School සමාගම ACCA සමාගමට චෙක්පතක් ලබා දී ඇත. මෙම ගනුදෙනු ACCA සමාගමේ පොත්වල සටහන් කිරීමට අදාල ප්‍රභව ලියවිලි අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?

1) ඉන්වොයිසිය, බැරපත සහ ලදුපත
2) ලදුපත, බැරපත සහ චෙක් පිටපත
3) ඉන්වොයිසිය, බැරපත සහ වවුචරය
4) ඉන්වොයිසිය, හරපත සහ ගෙවුම් වවුචරය
5) භාණ්ඩ ලැබීම් තුණ්ඩුව, හරපත සහ ගෙවීම් වවුචරය

**පහත දී ඇති තොරතුරු ඇසුරෙන් පහත ප්‍රශ්න තුන සඳහා පිළිතුරු සපයන්න.**

2024.03.01 දින Enrich Business School සමාගම රු. 100,000 ක් ආයෝජනය කරමින් වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර පහත ගනුදෙනු 2024.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී සිදු වී ඇත.මෙම ව්‍යාපාරය එකතු කල අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති අතර සියලුම ගැණුම් සහ විකුණුම් තුල 12% ක එකතු කල අගය මත බදු (VAT) ඇතුලත් වී ඇත.

| **අංකය** | **දිනය** | **ගනුදෙනුව** |
|---|---|---|
| **1.** | 2024.03.05 | රු. 22,400 ක භාණ්ඩ ණයට මිලදී ගැනීම |
| **2.** | 2024.03.15 | රු. 10,000 ක් වටිනා භාණ්ඩ රු. 22,400 කට ACCA ආයතනයට ණයට විකිණීම |
| **3.** | 2024.03.20 | රු. 12,000 ක මුදලක් කළමණාකරුට වැටුප් ලෙස ගෙවීම |
| **4.** | 2024.03.23 | සම්පූර්ණ ණය මුදල පියවීම සඳහා ACCA ආයතනයෙන් රු. 20,000 ක් ලැබීම |
| **5.** | 2024.03.25 | රු. 33,600 ක VAT සහිත අගයකට මෝටර් රථයක් ණයට මිලදී ගැනීම |

**(7)** **1,2,3,4**, සහ **5** යන ගනුදෙනු සටහන් කිරීමට අදාල මූලික පොත් අනුපිළිවෙලින් ,

1) විකුණුම් ජර්නලය, ගැණුම් ජර්නලය, මුදල් පොත, පොදු ජර්නලය, මුදල් පොත
2) විකුණුම් ජර්නලය, ගැණුම් ජර්නලය, පොදු ජර්නලය, මුදල් පොත, මුදල් පොත
3) විකුණුම් ජර්නලය, ගැණුම් ජර්නලය මුදල් පොත,මුදල් පොත, පොදු ජර්නලය
4) ගැණුම් ජර්නලය, මුදල් පොත, ,මුදල් පොත, විකුණුම් ජර්නලය, පොදු ජර්නලය
5) ගැණුම් ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් පොත, මුදල් පොත, පොදු ජර්නලය

**(8)** 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය සහ 2024.03.31 දිනට ගෙවිය/ලැබිය යුතු එකතු කල අගය මත බදු වටිනාකම වනුයේ,

| | **දළ ලාභය (රු.)** | **ලැබිය/(ගෙවිය) යුතු එකතු කල අගය මත බදු (රු.)** |
|---|---|---|
| 1) | 12,400 | 2,400 |
| 2) | (2,000) | 0 |
| 3) | 10,000 | 3,600 |
| 4) | (10,000) | 8,400 |
| 5) | (12,400) | (3,600) |

**(9)** 2024.03.31 දිනට වෙළඳ ව්‍යාපාරයේ මුළු හිමිකම සහ මුළු වත්කම වනුයේ,

| | **මුළු හිමිකම (රු.)** | **මුළු වත්කම (රු.)** |
|---|---|---|
| 1) | 98,000 | 154,000 |
| 2) | 100,000 | 120,400 |
| 3) | 95,600 | 174,000 |
| 4) | 95,600 | 154,000 |
| 5) | 98,000 | 174,000 |

**(10)** ආයතනයක පහත දී ඇති තොරතුරු මත 2024.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කළ යුතු මුදල් ශේෂය කොපමණද?

| | රු. |
|---|---|
| • 2024.03.31 දිනට බැංකු ප්‍රකාශනයට අනුව අයිරාව | (10,000) |
| • තැන්පත් කළ නමුත් 2024.03.31 දිනට උපලබ්ධි නොවූ චෙක්පත් | 45,000 |
| • නිකුත් කළ නමුත් 2024.03.31 දිනට ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ ඉදිරිපත් නොකළ චෙක්පත් | 30,000 |

- ණයගැතියන් විසින් සෘජුවම බැංකුවේ තැන්පත් කළ චෙක්පත් 15,000

1) රු. 5,000 2) රු. (20,000) 3) රු. 25,000
4) රු. (25,000) 5) රු. (40,000)

**(11)** ශක්ති ක්‍රීඩා සමාජයේ 2024.03.31 දිනට සාමාජික සංඛ්‍යාව 150 කි. ඉන් 50 දෙනෙකු යාවජීව සාමාජිකයන්ය. ඉතිරි එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 1,000 කි. සාමාජිකයින් 12 දෙනෙකු 2023/ 2024 වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නැත. සාමාජිකයින් 8 දෙනෙකු 2024/ 2025 වර්ෂය සඳහා ද සාමාජික මුදල් ගෙවා ඇත. යාවජීව සාමාජික මුදල් ගිණුමේ 2021.04.01 දිනට ශේෂය රු. 200,000 කි. ඉන් 10% ක ප්‍රමාණයක් 2023/2024 වර්ෂයේ සාමාජික මුදල් ආදායම් ලෙස ආදායම් හා වියදම් ගිණුමට මාරු කරනු ලැබේ. වසර මුල දී හිඟ හිටි හෝ ඉදිරියට ලද සාමාජික මුදල් නොපැවතුණි.
2023/2024 වර්ෂය තුළ ආදායම් ලෙස හඳුනා ගන්නා සාමාජික මුදල් වටිනාකම හා වර්ෂය තුල ලද සාමාජික මුදල කොපමණ ද?

| | **ආදායම ලෙස හඳුනාගන්නා වටිනාකම රු.** | **වර්ෂය තුළ ලද සාමාජික මුදල** |
|---|---|---|
| 1) | 96,000 | 120,000 |
| 2) | 120,000 | 100,000 |
| 3) | 120,000 | 96,000 |
| 4) | 120,000 | 120,000 |
| 5) | 150,000 | 96,000 |

**(12)** 2024.03.31 න් අවසන් වර්ෂය සඳහා ABC ලී බඩු නිෂ්පාදකයින් ගේ ගිණුම් පොත් වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

| | (රු.) |
|---|---|
| 2023.04.01 දිනට සාපේක්ෂව 2024.03.31 දිනට තොග වෙනස් වීම | |
| • අමුද්‍රව්‍ය තොගය | (60,000) |
| • නොනිමි තොග | 20,000 |
| • නිමි තොග | 30,000 |
| අමුද්‍රව්‍ය ගැණුම් | 500,000 |
| වඩු කාර්මිකයන්ගේ වැටුප් | 94,000 |
| නිෂ්පාදන සුපරීක්ෂක වේතන | 40,000 |
| කර්මාන්තශාලා විදුලිය | 10,000 |
| අනෙකුත් නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 36,000 |

- ප්‍රාථමික පිරිවැය මත පදනම්ව නොනිමි අගය කෙරේ.
- මෙම කාලපරිච්ඡේදය තුල ගෘහ භාණ්ඩ ඒකක 160 ක් නිෂ්පාදනය කර ඇත

2024.03.31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රාථමික පිරිවැය සහ ඒකක නිෂ්පාදන පිරිවැය වනුයේ,

| | **ප්‍රාථමික පිරිවැය (රු.)** | **ඒකක නිෂ්පාදන පිරිවැය (රු.)** |
|---|---|---|
| 1) | 634,000 | 4,500 |
| 2) | 554,000 | 4,000 |
| 3) | 460,000 | 3,412 |
| 4) | 540,000 | 3,912 |
| 5) | 500,000 | 4,500 |

**පහත ප්‍රශ්න දෙක සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිතා කරන්න.**

රුපියල් මිලියන 200 ක ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිතව 2022.04.01 දින එහි ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද Enrich Business School සමාගමේ 2023/24 සහ 2022/23 යන වර්ෂ සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

| විස්තරය | 2023/24 (රු. මිලියන) | 2022/23 (රු. මිලියන) |
|---|---|---|
| මුළු ආදායම | 300 | 200 |
| මුළු වියදම (ආදායම බදු හැර) | 180 | 240 |
| ආදායම් බදු | 40 | - |
| ගෙවූ ලාභාංශ | 20 | - |
| ප්‍රත්‍යාගණන සංචිත (මාර්තු 31 දිනට) | 30 | - |
| මුළු වත්කම් (මාර්තු 31 දිනට) | 300 | 210 |

**(13)** 2023.03.31 දිනට මුළු වගකීම් කොපමණද?

1) රු. මිලියන 10 2) රු. මිලියන 30 3) රු. මිලියන 40
4) රු. මිලියන 50 5) රු. මිලියන 120

**(14)** 2024.03.31 දිනට හිමිකම් කොපමණද?

1) රු.මිලියන 170 2) රු.මිලියන 190 3) රු.මිලියන 250
4) රු.මිලියන 230 5) රු.මිලියන 240

**පහත ප්‍රශ්න ද්විත්වය සඳහා මෙම තොරතුරු භාවිතා කරන්න.**

පහත සඳහන් තොරතුරු ACCA සමාගමේ ජනවාරි මස තොග ලෙජරයෙන් උපුටා ගන්නා ලදි.

- ජන. 05 ඒකකයක් රු. 20 බැගින් ඒකක 2,000 ක් මිල දී ගත්තා.
- ජන. 08 ඒකකයක් රු. 22 බැගින් ඒකක 3,000 ක් මිල දී ගත්තා.
- ජන. 12 ඒකක 2,500 ක් කර්මාන්ත ශාලාවට නිකුත් කළා.
- ජන. 17 ඒකක 1,000 ක් කර්මාන්ත ශාලාවට නිකුත් කළා.
- ජන. 25 ඒකකයක් රු. 23 බැගින් ඒකක 2,500 ක් මිල දී ගත්තා.
- ජන. 31 ඒකක 1,600 ක් කර්මාන්ත ශාලාවට නිකුත් කළා.

**(15)** ප්‍රථම ලැබීම ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට තොගයේ පිරිවැය වන්නේ,

1) රු. 54,200 2) රු.52,500 3) රු. 53,200
4) රු. 55,000 5) රු. 55,200

**(16)** බර තැබූ සාමාන්‍ය මිල ක්‍රමය යටතේ ඉතිරි තොගයේ පිරිවැය වන්නේ,

1) රු. 53,580 2) රු. 53,588 3) රු. 55,388
4) රු. 54,600 5) රු. 55,100

**පහත සඳහන් තොරතුරු යොදා ගනිමින් පහත ප්‍රශ්න ද්විත්වය සඳහා පිළිතුරු සපයන්න.**

නාමල් සහ වාරුණී පිළිවෙලින් 5 : 3 අනුපාතයට ලාභා ලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ.2023.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ පහත ශේෂයන් පැවතුණි.

| | මුළු හිමිකම (රු.) | ජංගම ගිණුම් ශේෂ (රු.) |
|---|---|---|
| නාමල් | 460,000 | (40,000) හර ශේෂය |
| වාරුණී | 360,000 | 60,000 |

2023.03.31 දින වාරුණී හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත් අතර නිම්මි නව හවුල් කරුවෙකු ලෙස එදිනම හවුල් ව්‍යාපාරයට බඳවා ගන්නා ලදි.නව හවුල් ව්‍යාපාරයේ ලාභා ලාභ සම සමව බෙදා ගැනීමට හවුල් කරුවන් ගිවිස ගන්නා ලදි.විශ්‍රාම ගන්නා දිනට හවුල් ව්‍යාපාරයේ මුළු කිර්ති නාමය තක්සේරු කරන ලද අතර නිම්මි ගේ කීර්තිනාම කොටස වූ රු. 40,000 ක කොටස ඇය විසින් මුදලින් ගෙන එන ලදි. මුදලින් ගෙන එන ලද කීර්තිනාම කොටසට අතිරේකව නිම්මි විසින් රු. 500,000 ක් ප්‍රාග්ධනය ලෙස හවුල් ව්‍යාපාරයට මුදලින් යොදවන ලදි. හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම තුලින් ගලපනු ලබයි.

**(17)** 2023.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ මුළු කීර්තිනාම වටිනාකම වන්නේ?

1) රු. 80,000　　2) රු. 100,000　　3) රු. 320,000
4) රු. 40,000　　5) රු. 30,000

**(18)** 2023.04.01 දිනට හවුල් ව්‍යාපාරයේ මුළු ප්‍රාග්ධන වටිනාකම වන්නේ ?

1) රු. 1,050,000　　2) රු. 1,010,000　　3) රු. 1,370,000
4) රු. 500,000　　5) රු. 960,000

**(19)** මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශන ගුණාත්මක ලක්ෂණ කිහිපයකින් සමන්විත වේ.එම ලක්ෂණ වලින් වැඩි දියුණු කිරීමේ ගුණාත්මක ලක්ෂණ (Enhancing Characteristics) පමණක් ඇතුලත් පිලිතුර වන්නේ,

1) අදාලත්වය, විස්වශනීය නියෝජ්‍යාත්වය ,සැසඳිය හැකි බව, සත්‍යාපනය කල හැකි බව
2) සැසඳිය හැකි බව, සත්‍යාපනය කල හැකි බව, කාලානුරූපී බව, තේරුම් ගත හැකි බව.
3) විස්වශනීය නියෝජ්‍යාත්වය ,සැසඳිය හැකි බව, සත්‍යාපනය කල හැකි බව, කාලානුරූපී බව.
4) සත්‍යාපනය කල හැකි බව, කාලානුරූපී බව, තේරුම් ගත හැකි බව, අදාලත්වය
5) කාලානුරූපී බව, තේරුම් ගත හැකි බව, විස්වශනීය නියෝජ්‍යාත්වය ,සැසඳිය හැකි බව

**(20)** සීමිත ACCA පොදු සමාගමේ 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂකවරු විසින් 2024.06.15 දින අනුමත කරන ලදී. 2024.03.31 දින සිට 2024.06.15 දක්වා කාලයේ දී පහත සිද්ධීන් සමාගමේ සිදු විය.

A. 2024.04.15 දින සිට ව්‍යාපාරයේ කොටසක් වසා දැමීමේ සැලැස්මක් නිවේදනය කරන ලද අතර, මේ මඟින් වාර්ෂිකව රු. 600,000 ක් ඉතිරි කිරීමට අපේක්ෂා කෙරේ.
B. රු. 1,000,000 ක අලාභයක් ජනනය කරමින් 2024.04.20 දින ප්‍රධාන නිෂ්පාදන පිරියතක් ගින්නකින් විනාශ විය.
C. 2024.04.30 දින සිදුකළ ණයට විකුණුම් නිසා ඇති වූ රු. 750,000 ක ශේෂයක් සහිත ණයගැතියකු 2024.05.30 දින බුන්වත් විය.
D. 2024.06.15 දින සාමාන්‍ය කොටස් හිමියන්ට රු. 300,000 ක අවසාන ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම.

LKAS 10 (වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉහත කුමන සිදුවීම් නොගළපන සිද්ධීන් ලෙස සලකනු ලබයි ද?

1) A හා B පමණි　　2) B හා C පමණි　　3) A, C හා D පමණි
4) B, C හා D පමණි　　5) A, B, C හා D යන සියල්ලම

**(21)** පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට, මූල්‍ය ප්‍රකාශන තුල තොගය හඳුනාගැනීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්ප පදනම සපයනු ලබයිද?

1) ප්‍රමාණාත්මක සහ ගැළපුම් සංකල්පය
2) ගැළපුම් සහ කාලච්ඡේද සංකල්පය
3) විචක්ෂණ සහ උපලබ්ධි සංකල්පය
4) විචක්ෂණ සහ ඓතිහාසික පිරිවැය සංකල්පය
5) විචක්ෂණ සහ ගැළපුම් සංකල්පය

**(22)** Enrich Business School සමාගම කල්බදු ක්‍රමය යටතේ තරිඳු සමාගමෙන් යන්ත්‍රයක් 2023.04.01 දින මිලදී ගන්නා ලදී. ගිවිසුමට අදාළ කොන්දේසි,

- ගිවිසුමට අදාළ යන්ත්‍රයේ සාධාරණ වෙළඳපල අගය රු. 650,000
- මූලික ගෙවීම රු. 250,000
- වාර්ෂික කල්බදු වාරිකය රු. 160,000 කි.(2024.03.31 දින ගෙවන ලදි)
- කල්බදු ගිවිසුමේ කාලය වසර 04 කි. වාර්ෂික කල්බදු පොළිය 20% කි.

2023/24 වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ගලපන ලද කල්බදු පොළිය, 2024.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් සහ ජංගම නොවන වගකීම් වන්නේ,

| | **කල්බදු පොලිය (රු.)** | **ජංගම වගකීම් (රු.)** | **ජංගම නොවන වගකීම් (රු.)** |
|---|---|---|---|
| 1) | 80,000 | 160,000 | 80,000 |
| 2) | 130,000 | 96,000 | 224,000 |
| 3) | 80,000 | 96,000 | 224,000 |
| 4) | 80,000 | 160,000 | 160,000 |
| 5) | 48,000 | 96,000 | 224,000 |

**(23)** ගිණුම් ප්‍රතිපත්තියක් යනු "නිර්දේශිත මහපෙන්වීමකි." සමාගමක් භාවිතා කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තියක් වෙනස්කළ හැකි අවස්ථාවන් වන්නේ,

A. මහා සභාරැස්වීමකදී විශේෂ යෝජනාවක් සම්මත වීම තුලින්,
B. ගිණුම්කරණ ප්‍රමිතියක අවශ්‍යතාවය මත,
C. කොටස් හිමියන්ගේ ලිඛිත ඉල්ලීමක් සමාගමට ලැබී ඇති විටෙක,
D. ආයතනයේ මූල්‍ය තත්ත්වය, කාර්ය සාධනය හෝ මුදල් ප්‍රවාහය කෙරෙහි පෙරට වඩා විශ්වාසදායි ලෙස තොරතුරු සැපයීම සඳහා වෙනස් කිරීම අවශ්‍ය විටෙක,

වඩාත් නිවැරදි අවස්ථාව/න් වන්නේ,

1) A හා C පමණි
2) D හා A පමණි
3) B හා A පමණි
4) C හා D පමණි
5) B හා D පමණි

**(24)** 2023 දෙසැම්බර් මාසය සඳහා ACCA සමාගමේ සේවකයින්ගේ දළ වැටුප රු. 300,000 ක් විය.සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේව්‍ය සේවක දායකත්වය පිළිවෙළින් 15% ක් 10% ක් වේ. සේවා නියුක්ත භාර අරමුදලට දායකත්වය 3% කි. මාසය තුළ දී සේවකයන්ගෙන් නැවත අය කළ ණය ප්‍රමාණය රු. 40,000 කි.

2023 දෙසැම්බර් මාසය සඳහා **"ශුද්ධ වේතනය"** හා සමාගමේ **"සේවකයන්ට අදාල මුළු වියදම"** කොපමණද?

| **ශුද්ධ වේතනය (රු.)** | **සේවකයන්ට අදාල මුළු වියදම (රු.)** |
|---|---|

| | | |
|---|---|---|
| 1) | 230,000 | 354,000 |
| 2) | 255,000 | 394,000 |
| 3) | 230,000 | 300,000 |
| 4) | 270,000 | 354,000 |
| 5) | 300,000 | 384,000 |

**(25)** X නමැති අමුද්‍රව්‍යයෙහි කාර්තුවක ඉල්ලුම් ඒකක 1,250 කි. එම ද්‍රව්‍යයෙහි ඒකකයක ගැනුම් මිල රු. 250 කි. තොග ඇණවුම් පිරිවැය ඇණවුමකට රු. 25 ක් වන අතර, තොග රඳවා ගැනීමේ පිරිවැය ඒකකයක ගැනුම් මිලෙන් 10% ක් වේ. මෙම අමුද්‍රව්‍යයෙහි ආර්ථික ඇණවුම් ප්‍රමාණය,

1) ඒකක 50 කි
2) ඒකක 100 කි
3) ඒකක 1,000 කි
4) ඒකක 2,500 කි
5) ඒකක 5,000 කි

**(26)** පහත තොරතුරු වර්ෂයක් තුළ දී නිෂ්පාදන සමාගමක් විසින් භාවිත කළ "A" නැමැති අමුද්‍රව්‍යට අදාළ වේ.

| | **අවම** | **උපරිම** |
|---|---|---|
| පරිභෝජනය (ඒකක) | 2,000 | 5,000 |
| පොරොත්තු කාලය (මාස) | 4 | 6 |

උපරිම තොග මට්ටම ඒකක 42,000 කි.

මෙම ද්‍රව්‍යයේ යළි ඇණවුම් මට්ටම සහ යළි ඇණවුම් ප්‍රමාණය,

| | **යළි ඇණවුම් මට්ටම (ඒකක)** | **යළි ඇණවුම් ප්‍රමාණය (ඒකක)** |
|---|---|---|
| 1) | 17,500 | 32,500 |
| 2) | 20,000 | 30,000 |
| 3) | 20,000 | 39,500 |
| 4) | 30,000 | 20,000 |
| 5) | 30,000 | 29,500 |

**(27)** ACCA සමාගමේ නිමැවුම් සහ සැකසුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් පවතී.එම දෙපාර්තමේන්තු වල අයවැයගත සහ සත්‍ය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය පහත පරිදි විය.

| | **නිමැවුම්** | **සැකසුම්** |
|---|---|---|
| අයවැයගත නිෂ්පාදන පොදු කාර්ය | රු. 500,000 | රු. 300,000 |
| සත්‍ය නිෂ්පාදන පොදු කාර්ය | රු. 600,000 | රු. 320,000 |
| අයවැයගත යන්ත්‍ර පැය | 50,000 | 15,000 |
| සත්‍ය යන්ත්‍ර පැය | 40,000 | 16,000 |

පොදු කාර්ය පිරිවැය අන්තර් ග්‍රහණය කිරීම සඳහා දෙපාර්මේන්තු ද්විත්වයම යන්ත්‍ර පැය පදනම යොදා ගන්නේ නම් මෙම දෙපාර්තමේන්තු වල පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත වන්නේ,

| | **නිමැවුම් දෙපාර්තමේන්තු (යන්ත්‍ර පැයකට රු.)** | **සැකසුම් දෙපාර්තමේන්තු (යන්ත්‍ර පැයකට රු.)** |
|---|---|---|
| 1) | 11 | 20 |
| 2) | 15 | 20 |
| 3) | 12.5 | 18.75 |
| 4) | 12 | 21.3 |

| | | |
|---|---|---|
| 5) | 10 | 20 |

**(28)** සීමිත Enrich Business School පොදු සමාගමේ 2024.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාලව පහත තොරතුරු සපයා ඇත.

| | **(රු ,000)** | |
|---|---|---|
| විකුණුම් | 1,000 | |
| විකුණුම් පිරිවැය | 500 | |
| කාලපරිච්ඡේදය සඳහා ලාභය | 100 | |
| | **2024.03.31 දිනට (රු ,000)** | **2023.03.31 දිනට (රු ,000)** |
| තොග | 120 | 80 |
| ණයගැතියෝ | 40 | 60 |
| ණයහිමියෝ | 60 | 40 |

- සියලුම ගැණුම් සහ විකුණුම් ණය පදනම මත සිදු කෙරේ.

Enrich Business School පොදු සමාගමේ තොග පිරිවැටුම් අනුපාතය සහ ණයගැති පිරිවැටුම් අනුපාතය වන්නේ,

| | **තොග පිරිවැටුම් අනුපාතය (වාර)** | **ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර)** |
|---|---|---|
| 1) | 5 | 20 |
| 2) | 4.16 | 2 |
| 3) | 6.2 | 10 |
| 4) | 8.3 | 7 |
| 5) | 2 | 9 |

**(29)** සමාගමක ක්‍රියාකාරී මට්ටම් දෙකක නිෂ්පාදන පිරිවැය පහත වේ.

| **ක්‍රියාකාරී මට්ටම (ඒකක)** | **නිෂ්පාදන පිරිවැය** |
|---|---|
| 10,000 | 500,000 |
| 20,000 | 900,000 |

ඒකක 25,000 වන විට මුළු නිෂ්පාදන පිරිවැය කොපමණද?

1) රු. 1,000,000 2) රු. 1,100,000 3) රු. 1,200,000
4) රු. 1,300,000 5) රු. 1,400,000

**(30)** සමාගම පැරණි යන්ත්‍රය වෙනුවට නවීන තාක්‍ෂණය සහිත නව යන්ත්‍රයක් මිලදී ගැනීමට සලකා බලමින් සිටී. යන්ත්‍ර මිලදී ගැනීමට හා පැරණි යන්ත්‍රය සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

- පැරණි යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට සේවකයන් තිදෙනෙකු අවශ්‍ය වූ අතර නව යන්ත්‍රය එක සේවකයෙකුගෙන් ක්‍රියාත්මක කල හැක.සේවකයෙකුගේ වාර්ෂික වැටුප රු. 50,000 කි.
- නව යන්ත්‍රයේ පිරිවැය රු. 500,000 ක් වන අතර පැරණි යන්ත්‍රය රු. 200,000 කට අලෙවි කල හැක.
- නව යන්ත්‍රයේ ඵලදායි ජීව කාලය වර්ෂ 05 කි.

- වට්ටම් අනුපාතය 10% යටතේ වට්ටම් සාධක පහත පරිදි වේ.

| **වර්ෂ** | **1** | **2** | **3** | **4** | **5** |
|---|---|---|---|---|---|
| **වට්ටම් සාධකය** | 0.90 | 0.82 | 0.75 | 0.68 | 0.62 |

මෙම ආයෝජනයේ ශුද්ධ වර්තමාන අගය වන්නේ,

1) රු. 77,000
2) (රු. 77,000)
3) රු. 500,000
4) රු. 377,000
5) (රු. 123,000)

**(31)** පහත දැක්වෙන තොරතුරු Enrich Business School ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශ වලින් උපුටා ගන්නා ලදී.

| | (රු, 000) |
|---|---|
| 2023.03.01 දිනට ආරම්භ තොගය | 4,000 |
| ගැණුම් | 26,000 |
| විකුණුම් | 30,000 |

විකුණුම් මත දළ ලාභ අනුපාතය 25% කි. අවසාන තොගයෙන් 40% ක් ඉතිරිව තිබුණු අතර අනෙක් තොග ගින්නෙන් විනාශ විය. හානි වු තොග වටිනාකමින් 80% ක් ගෙවීමට රක්ෂණ සමාගම පොරොන්දු වී ඇත. හානි වු තොග අලාභය වන්නේ,

…...........................................................................................................................................

**(32)** ACCA සමාගමේ 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමෙන් අනතුරුව පහත දැක්වෙන වැරදි සහ මග හැරීම් හඳුනාගන්නා ලදි.කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන වලට අනුව වර්ෂයේ ලාභය රු. 230,000 ක් විය.

- රු. 100,000 ක ලී බඩු වර්ෂයේ මාස 9 ක් ගතවීමෙන් පසුව මිලදී ගෙන ඇත. එහෙත් මෙම ලී බඩු වල පිරිවැය ලී බඩු අලුත්වැඩියා වියදම් ගිණුමට හර කර ඇත. ලී බඩු පිරිවැයෙන් 5% ක් ක්ෂය කරනු ලැබේ.
- රු. 4,500 ක ණයට ගැණුම් ආපසු යැවීම්, ආපහු එවුම් ජ'නලය තුළ සටහන් කිරීම.
- රු. 6,400 ක ලද විකුණුම් අත්තිකාරම් ණයට විකුණුම් ලෙස සලකා ගිණුම් ගත කර ඇත.
- රු. 40,000 ක් පිරිවැය වු භාණ්ඩ හානි වු අතර එයින් 75% ක වන්දියක් ලබාදීමට රක්ෂණ සමාගම එකඟ වී ඇත. මේ සම්බන්ධව කිසිඳු සටහනක් පොත් වල තබා නොමැත
- රු. 8,000 ක ලද කොමිස් ගෙවු කොමිස් ලෙස සටහන් කර ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් අනතුරුව 2024.03.31 දිනෙන් අවසන් වර් ෂයේ නිවැරදි ලාභය වන්නේ,

……………………………………………………………..................................................................

**(33)** පහත සඳහන් ගනුදෙනු ලී බ ඩු අලෙවි කරන සීමිත නාමල් සමාගමේ 2024.03.31න් අවසන් වර් ෂයට අදාල වේ.

**ගනුදෙනුව**

1 අලෙවි කිරීම සඳහා රු. 500,000 වටිනා ලී බඩු මොරටු ට්‍රේඩර්ස් වෙතින් ණයට මිලදී ගැනීම
2 සේවක වැටුප් රු. 100,000 ක් මුදලින් ගෙවීම.
3 ආයතනයේ පරිහරණයට රු. 20,000 ක් වටිනා ලී බඩු ණයට මිලදී ගැනීම
4 බොල්ණය රු. 40,000ක් කපා හැරීම

ඉහත ගනුදෙනු වලට අදාල මූලාශ්‍ර ලේඛන සහ මූලික පොත් සඳහන් කරන්න.

| | **මූලාශ්‍ර ලේඛන** | **මූලික පොත** |
|---|---|---|
| 1 | ........................ | ........................ |
| 2 | ........................ | ........................ |
| 3 | ........................ | ........................ |
| 4 | ........................ | ........................ |

**(34)** ACCA සමාගමේ 2024.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය පහත සඳහන් ආකාරයට ණයගැති ලෙජරය සමඟ සංසන්දනය කර ඇත. උපලෙජරජ නිවැරදිව සකස් කර ඇත.

| | **(රු.'000)** |
|---|---|
| ණයගැති පාලන ගිණුමේ ශේෂය | 8,000 |
| **එකතු කළා:** බොල් ණය අධිගණනය වීම | 50 |
| **අඩු කළා:** විකුණුම් අධිගණනය වීම | -150 |
| ණයගැති ලෙජරයේ ශේෂය | 7,900 |

කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ, ඉහත සැසඳුමෙහි හෙළිදරව් කර ඇති තොරතුරු සැලකිල්ලට නොගැනීමෙනි. වර්ෂයේ ලාභය හා 2024.03.31 දිනට ජංගම වත්කම් පිළිවෙළින් රු. 2,000,000 ක් හා රු. 15,000,000 ක් විය. සැසඳුමෙහි දක්වා ඇති තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසු පහත දෑ ගණනය කරන්න.

(අ) වර්ෂයේ ලාභය : රු. ..........................................................................................................

(ආ) 2024.03.31 දිනට ජංගම වත්කම්: රු. ...........................................................................

**(35)** බැංකු ප්‍රකාශනයට අනුව මුදල් ශේෂය, මුදල් පොතේ ශේෂයෙන් වෙනස් වන විටදී, මුදල් පොත ගැළපීමට තුඩු නොදෙන අයිතම දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................
2. ..........................................................................................................

**(36)** ව්‍යාපාරයක රු. 13,000 ක ගැනුම් ඉන්වොයිසියක්, ගැනුම් ජර්නලයේ රු. 31,000 ක් ලෙස වාර්තා කොට එය පොදු ලෙජරයට ද පිටපත් කොට ඇත.

අ) ඉහත වරද නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන ලියන්න. (සංලක්ෂ අවශ්‍ය නොවේ)

..........................................................................................................

..........................................................................................................

ආ) මෙම වරද නිසා ලාභයට ඇතිවන බලපෑම කොපමණ දැයි තීරණය කර එය වැඩිවීමක් ද අඩු වීමක් ද වෙනස් නොවීමක් ද යන්න සඳහන් කරන්න.

..........................................................................................................

**(37)** පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

සත්‍ය
අසත්‍ය

A. අදාලත්වය සහ සැසඳිය හැකි බව මූල්‍ය ප්‍රකාශන වල මූලික ගුණාත්මක ලක්ෂණ වේ. ....................
B. තොග විකුණූ විට එම තොගවල පිරිවැය අදාළ ආදායම ඉපයූ කාලපරිච්ඡේදය තුල වියදමක් ලෙස හඳුනා ගත යුතු ය. ....................
C. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව අවශ්‍ය නොවන්නේ නම් හෝ අවසර දී නොමැති නම් වත්කම් වලට එරෙහිව වගකීම්ද, ආදායම්වලට එරෙහිව වියදම් ද හිලව් නොකළ යුතුය. ....................
D. FIFO ක්‍රමයට තොග අගය කිරීමේදී ලාභය සාපේක්ෂව වැඩි අගයක් ගනී. ....................

**(38)** ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩව පැවැත්මේ සංකල්පය නොසලකා හැරිය හොත් එම මූල්‍ය ප්‍රකාශන වලට ඇතිවන ප්‍රධාන බලපෑම් 2 ක් නම් කරන්න.

I. ..........................................................................................................................................
II. ..........................................................................................................................................

**(39)** නාමල් සහ ධනුෂ්ක එක්ව හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර ඔවුන් අතර ලිඛිත හවුල් ගිවිසුමක් නොතිබුණි.ඒ අනුව පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

සත්‍ය
අසත්‍ය

A. හවුල් ව්‍යාපාරයේ ලාභා ලාභ සම සමව බෙදා ගත යුතුය. ....................
B. හවුල් කරුවන් හවුල් ව්‍යාපාරයට සපයන ණය සඳහා 10% ක වාර්ෂික පොලියක් ලබා දිය යුතුය . ....................
C. කිසිම හවුල් කරුවෙකුට වැටුප් ලබා ගැනීමට නොහැක. ....................
D. සියලුම හවුල් කරුවන් ප්‍රාග්ධනයට සමානව දායක විය යුතුය. ....................

**(40)** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට (LKAS 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති,ඇස්තමේන්තු සහ වැරදි) අනුව ගිණුම්කරණ ඇස්තමේන්තුවක් හේතු දෙකක් මත වෙනස් විය හැකිය. එම හේතු ද්විත්වය සඳහන් කරන්න.

I. ..........................................................................................................................................
II. ..........................................................................................................................................

**(41)** 2024.03.31 දිනට අවසාන තොගයේ පිරිවැය රු. 1,060,000 කි. පිරිවැය රු. 160,000 ක් වූ තොගයක් ඉහත තොගයේ ඇතුලත්ව ඇති අතර මෙම තොගය විවෘත වෙළෙඳපොළේ රු. 110,000 කට විකිණීමට අපේක්ෂා කෙරේ. 2024 මාර්තු 31 දිනට ව්‍යාපාරයේ තොගය භෞතිකව ගණනය කරන අතර, විකිණීම හෝ ආපසු එවීමේ පදනමට යවා ඇති එහෙත් ශේෂ පත්‍ර දිනට ආපසු එවීමේ දින ඉකුත් නොවූ බෙදාහරින්නන් වෙත යවා ඇති භාණ්ඩවල විකුණුම් මිල රු. 210,000 කි. මෙම භාණ්ඩ පිරිවැයට 5% ක ලාභාන්තිකයක් එකතුකර ඉන්වොයිස් කර ඇත. 2024 මාර්තු 31 දිනට අවසාන තොගයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය වන්නේ,

පිරිවැය : ..........................................................................................

ශුද්ධ උපලබ්ධි අගය : ...................................................................

**(42)** XYZ යනු ජංගම දුරකථනජාල සේවා සපයන විදුලි සංදේශ සමාගමකි.2023.10.01 දින සමාගම නවීන ඇපල් දුරකථනයක් සහ එහි දුරකථන ජාල සම්බන්ධතාවය වර්ෂයක කාලයක් සඳහා ලබා දීමට ගිවිසුමකට

එලඹුණි.ගිවිසුම අනුව මසකට රු. 15,000 ගනුදෙනුකරුවා විසින් XYZ ආයතනයට ගෙවිය යුතුය. ඇපල් දුරකථනයේ වෙළඳපල මිල රු. 168,000 ක් වන අතර දුරකථන ජාල සම්බන්ධතාවය සඳහා මසකට රු. 1,000 කි.

(අ) SLFRS 15 අනුව 2024.03.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ වල ආදායම් ලෙස හඳුනාගත හැකි අගය වන්නේ?

.......................................................................................................................................

(ආ) SLFRS 15 අනුව 2024.03.31 දිනට නොඉපයූ ආදායම වන්නේ ?

.......................................................................................................................................

**(43)** 2023.10.01 දින ACCA ආයතනය වසර 5 ක කාලයක් සඳහා රු. 2,000,000 ක සාධාරණ අගයක් සහිත මෝටර් රථයක් කල්බදු ක්‍රමය යටතේ ලබා ගන්නා ලදී.වත්කමේ සාධාරණ අගයෙන් 80%ක් කල්බදු ආයතනය මූල්‍යනය කරන අතර ඉතිරි ප්‍රමාණය ACCA ආයතනය ගෙවිය යුතු වේ.මෙම කල්බදු පහසුකම ලබා ගැනීම සඳහා මුද්දර ගාස්තු සහ අනෙකුත් ඍජු වියදම් ලෙස ACCA ආයතනයට රු. 200,000 ක් වියදම් විය. වත්කමේ ඵලදායි ජීව කාලය වර්ෂ 5ක් වන අතර වාර්ෂික කල්බදු වාරිකය රු. 400,000 කි.වාර්ෂික කල්බදු පොලී අනුපාතය 10% කි.

(අ) 2024.03.31 දිනට භාවිත අයිතිය ඇති වත්කමේ ශුද්ධ අගය ?...................................................................

(ආ) මෙම ගනුදෙනුව නිසා 2024.03.31න් අවසන් වර්ෂයේ ලාභයට වන ශුද්ධ බලපෑම ? ..................................

**(44)** සීමාසහිත Enrich Business School පොදු සමාගම අධ්‍යක්ෂක මණ්ඩලය සංචිත ප්‍රාග්ධනිත කිරීමට අපේක්ෂා කරයි. සංචිත ප්‍රාග්ධනිත කිරීමෙන් සමාගමට සහ කොටස් හිමියන්ට අත්වන වාසි 2 බැගින් සඳහන් කරන්න.

**සමාගමට:-**

I. .......................................................................................................................................

II. .......................................................................................................................................

**කොටස් හිමියන්ට:-**

I. .......................................................................................................................................

II. .......................................................................................................................................

**(45)** 2024.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී සීමිත ACCA සමාගම රු. 20 බැගින් සාමාන්‍ය කොටස් 500,000 ක පරිණත ප්‍රසිද්ධ නිකුතුවක් සිදුකරන ලදී. මුළු මුදල ද සමඟ කොටස් 750,000 ක් සඳහා අයදුම්පත් ලැබිණි. කොටස් 500,000 ක් සමානුපාතිකව විභජනය කරන ලද අතර අතිරික්ත මුදල් අයදුම්කරුවන් වෙත ආපසු යවන ලදී.

පහත දෑ සඳහා ජර්නල් සටහන් ලියා දක්වන්න. (සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ)

(අ) අතිරික්ත අයදුම්පත්වල මුදල් ආපසු යැවීම

..............................................................................................................

..............................................................................................................

(ආ) කොටස් විභජනය කිරීම

..............................................................................................................

..............................................................................................................

**(46)** පහත එක් එක් අවස්ථාවේ සමාගමක ණය - හිමිකම් අනුපාතය වැඩිවේ. අඩු වේ ද, වෙනස් නොවේ ද යන්න සඳහන් කරන්න.

| අවස්ථාව | ණය - හිමිකම් අනුපාතය මත බලපෑම |
|---|---|
| 1. වත්කම් ඉහළ අගයකට ප්‍රත්‍යාගණනය කිරීම | ................................................................ |
| 2. දිගු කාලීන ණයක් ලබා ගැනීම | ................................................................ |
| 3. ණයට භාණ්ඩ මිල දී ගැනීම | ................................................................ |
| 4. නව කොටස් නිකුතුවක් සිදු කිරීම | ................................................................ |

**(47)** 2024 ජූනි මාසය සඳහා සමාගමක වැටුප් සාරාංශය පහත දී ඇත.

| විස්තරය | රු. |
|---|---|
| මූලික වැටුප | 200,000 |
| දීමනා | 25,000 |
| සේවක අර්ථසාධක මුදල් අඩු කිරීම | 8,000 |
| උත්සව අත්තිකාරම් අඩු කිරීම | 7,000 |
| ශුද්ධ වැටුප | 210,000 |
| සේවා අර්ථසාධක අරමුදල් දායකය | 24,000 |

ජූනි මාසය සඳහා සමාගමේ සේවකයින්ට අදාළ මුළු වියදම කොපමණද?.................................................

**(48)** ගිණුම්කරණ අනුපාතවල සීමා දෙකක් සඳහන් කරන්න.

I. ........................................................................................................................................

II. ........................................................................................................................................

**(49)** සමාගමක් තම නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍යයක යළි ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා ආර්ථික ඇණවුම් ප්‍රමාණ (EOQ) ආකෘතිය භාවිතා කරයි. පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| වාර්ෂික ඉල්ලුම | ඒකක 40,000 |
| ඒකක 8,000 ක ඇණවුම් ප්‍රමාණයක දී මුළු වාර්ෂික ඇණවුම් පිරිවැය | රු. 5,000 |
| ඒකකයක වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය | රු. 5 |

පහත දෑ ගණනය කරන්න.

(අ) ඇණවුමක ඇණවුම් පිරිවැය : රු. ........................................

(ආ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය : ඒකක ....................................

**(50)** පහත සඳහන් තොරතුරු නිෂ්පාදිතයකට අදාළ වේ.

| | |
|---|---|
| ඒකක 50 ක් විකුණන විට මුළු පිරිවැය | රු. 65,000 |
| ඒකක 75 ක් විකුණන විට මුළු පිරිවැය | රු. 90,000 |
| දායක විකුණුම් අනුපාතය | 50% |

රු. 125,000 ක ලාභයක් ලැබීමට අලෙවි කළ යුතු ඒකක ප්‍රමාණය ගණනය කරන්න.

..........................................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි/அனைத்து உரிமைகளும்/All Right Reserved

WWW.QUESTIONBANK.LK

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

**ගිණුම්කරණය** | 33 | S | II | **පැය තුනයි**

**අමතර කියවීම් කාලය - මිනිත්තු (10) යි**
**Additional Reading Time - 10 minutes**

විභාග අංකය :.............................................................

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිලිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදා ගන්න**

**වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

**උපදෙස්**

* **පලමුවන** හා **දෙවන** ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිලිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිලිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
* අදාල පෙරවැඩ, පිලිතුරු පත්‍රය සමග අමුණන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

---

**(1)** සී/ස Enrich Business School පොදු සමාගමේ 2024.03.31 දිනට ශේෂ පිරික්සුම පහත වේ.

ශේෂ පිරික්සුම

| | (රු.000) | (රු.000) |
|---|---|---|
| ගැණුම් හා විකුණුම් | 11,700 | 16,800 |
| වෙලඳ ණයගැතියෝ හා වෙලඳ ණයහිමියෝ | 3,400 | 1,800 |
| ආදායම් බදු ගෙවීම - 2022/23 | 240 | |
| ගෙවූ ගැණුම් අත්තිකාරම් | 560 | |
| වගකීම් සහතික සඳහා ගෙවීම් | 280 | |
| වගකීම් සහතික සඳහා වෙන් කිරීම | | 180 |
| වෙලඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ | 120 | |
| වෙලඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම - 2023.04.01 | | 700 |
| ආරම්භක තොග | 1,200 | |
| දේපළ පිරියත හා උපකරණ | 4,700 | |
| දේ.පි.උ. සම්මුචිත ක්ෂය වෙන් කිරීම | | 1,450 |
| ආයතනික හා පරිපාලන වියදම් | 5,200 | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් 132,000) | | 6,320 |
| රඳවාගත් ලාභ | | 2,000 |
| පොදු සංචිතය | | 1,700 |
| ආදායම් බදු වෙන් කිරීම - 2022/23 | | 60 |
| බෙදාහැරීම් වියදම් | 1,880 | |
| වෙනත් වියදම් | 120 | |
| විකුණුම් අත්තිකාරම් | | 1,500 |
| ඉදිරියට කල වියදම් | 120 | |
| බැංකු සහ මුදල් | 2,990 | |
| | 32,510 | 32,510 |

**අතිරේක තොරතුරු,**

I. 2024.03.31 දිනට ව්‍යාපාරයේ පැවති භෞතික අවසන් තොගයේ පිරිවැය 230,000 ක් වූ අතර මාර්ගස්ථව පැවති 90,000 ක තොගයක් මාර්ග අනතුරක් හේතුවෙන් සම්පූර්ණයෙන්ම විනාශ වී ඇත. විනාශවන අවස්ථාව වන විට තොගයේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ ආයතනයට මාරු වී තිබිණි.

II. ව්‍යාපාරයේ ගිණුම් කටයුතු ආධුනික ගණකාධිකාරීවරයෙක් විසින් සිදුකල අතර පහත ගිණුම්කරණ වැරදි ඔහු විසින් සිදුකර ඇති බව පසුව සොයාගන්නා ලදි.

- රු. 30,000 ක් හා 25,000 ක් වූ හරපත් දෙකක් පොත් වල සටහන් නොකිරීම.
- 65,000 ක ලද වට්ටමක් දුන් වට්ටමක් සේ ගිණුම් තැබීම
- සේවකයෙකු ආයතනයෙන් නැවත ගෙවීමේ පොරොන්දු පිට ලබාගත් රු. 100,000 ක ණය මුදලක් වියදමක් සේ සලකා ගිණුම්ගත කිරීම. එම වියදම ආයතන හා පරිපාලන වියදම් තුල ඇතුලත් වේ.

III. ආයතනය සේවකයන් වෙනුවෙන් රක්ෂණාවරණයක් 2024.01.01 දින ලබාගෙන ඇති අතර එහි වලංගු කාලය වසරකි. එම රක්ෂණාවරණයේ සම්පූර්ණ වියදමින් 50% ක් ආයතනය දරන අතර ඉතුරු 50% සේවකයන්ගේ වැටුපෙන් මාස 12 ක් තුල අඩු කරගනු ලැබේ. රක්ෂණ ආයතනයට ගෙවූ රු. 240,000 ක් වූ සම්පූර්ණ මුදල වියදමක් සේ සලකා ආයතනික හා පරිපාලන වියදම් තුල ඇතුලත් ඇත. (2024.03.31 වන විට කිසිදු මුදලක් සේවකයන්ගෙන් අයකරගෙන නොමැත)

IV. ආයතනය කල්බදු සමාගමක් සමඟ මෝටර් රථයක් මිල දී ගැනීමට 2024.01.01 දින ගිවිසුමකට එළඹුනි. එම ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.

- කල්බදු කාලය වසර 04 කි.
- මෝටර් රථයේ ගැණුම් මිලෙන් 25% ක් මුලික තැන්පතුව ලෙස ලබා දිය යුතුය.
- සෑම වසරකම දෙසැම්බර් 31 වන දින කල්බදු වාරිකය ගෙවිය යුතු වේ.
- මොටර් රථයේ ගැණුම් මිල රු. 2,000,000 කි.
- වාර්ෂික වාරිකයක වටිනාකම රු. 500,000 කි.
- කල්බදු ගිවිසුම අවසානයේ මෝටර් රථය ව්‍යාපාරයට හිමි වේ.

ආයතනයේ ක්ෂය ප්‍රතිපත්ති අනුව සියලුම මෝටර් රථ 20% බැගින් සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරනු ලැබේ. ගෙවූ මුදල් මෝටර් රථ ගිණුම හර කිරිම හැර වෙනත් කිසිදු සටහනක් තබා නැත.

කල්බදු වාරික වල අඩංගු පොලිය පහත පරිදි වේ.

| | |
|---|---|
| පළමු වාරිකය | 200,000 |
| දෙවන වාරිකය | 120,000 |
| තුන්වන වාරිකය | 100,000 |
| හතරවන වාරිකය | 80,000 |

V. ආයතනයේ දේපල පිරියත හා උපකරණ පහත පරිදි වේ.

| **අයිතමය** | **පිරිවැය** | **ශුද්ධ අගය** |
|---|---|---|
| ඉඩම් | 1,000,000 | 1,000,000 |
| ගො/නැ | 500,000 | 250,000 |
| මෝටර් රථ | 2,500,000 | 1,500,000 |
| ලී බඩු | 700,000 | 500,000 |

කල්බදු ක්‍රමයට මිල දී ගත් මෝටර් රථය හැර කිසිදු දේපලක් මිල දී ගෙන හෝ විකුණා නොමැත. සියලුම දේපල 20% බැගින් සරල මාර්ග ක්ෂය ක්‍රමයට අනුව ක්ෂය කරනු ලැබේ.

VI. 2024.01.05 දින පැවතුන කොටස් 10 කට 2 ක් වන සේ කොටසක් රු.10 බැගින් හිමිකම් නිකුතුවක් සිදු කල අතර එම නිකුතුවෙන් 50% ක් පමණක් කොටස්කරුවන් විසින් මිල දී ගන්නා ලදි. පසුව පැවති සෑම කොටස්

10 කට 1 ක් වන සේ කොටසක් රු.10 බැගින් ප්‍රසාද කොටස් නිකුතුවක් ද සිදු කරන ලදි. මෙම සියලු ගනුදෙනු නිවැරදිව ගිණුම් තබා ඇත.

VII. වර්ෂ අවසාන ණයගැති ශේෂය මත 5% ක් වෙලඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

VIII. ආයතනය වගකීම් සහතික මත භාණ්ඩ විකුණන අතර අතීත අත්දැකීම් මත සෑම විකුණුම් රුපියලකටම 2% වන සේ අලුත්වැඩියා වියදම් දැරීමට ආයතනයට සිදු වන බව විශ්වසනීයව ඇස්තමේන්තු කර ඇත.

IX. ආදායම් බදු අනුපාතය 25 % කි.

X. අධ්‍යක්ෂකවරු පහත යෝජනා 2024.04.05 දින සිදු කර ඇත.

- සාමාන්‍ය කොටස් හිමියන්ට රු. 5 ක අවසන් ලාභාංශයක් ගෙවීමට
- පොදු සංචිතයට රු. 150,000 මාරු කිරීමට

**අවශ්‍ය වන්නේ,**

1. 2024.03.31 න් අවසන් වර්ෂය සඳහා සී/ස Enrich Business School පොදු සමාගමේ ලාභලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය
2. 2024.03.31 න් අවසන් වර්ෂය සඳහා සී/ස Enrich Business School පොදු සමාගමේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
3. 2024.03.31 දිනට සී/ස Enrich Business School පොදු සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශනය
4. ගිණුම්කරණ සටහන්

**(2)** **(අ)** නිෂ්පාදන ආයතනයක් X සහ Y නමින් භාණ්ඩ වර්ග 2 ක් නිෂ්පාදනය කරන අතර පිරිවැයකරණය සඳහා නිමැවුම් සහ එකලස් නමින් නිෂ්පාදන දෙපාර්තමේන්තු ද්විත්වයක් සහ ගබඩාව ලෙස එක් සේවා දෙපාර්තමේන්තුවක් හඳුනාගෙන ඇත. ඉදිරි වර්ෂය සඳහා අයවැය ගත තොරතුරු පහත පරිදි ලබා දී ඇත.

| විස්තරය | පොදුකාර්ය පිරිවැය රු. 000 | මූළ ඍජු පිරිවැය රු. 000 | |
|---|---|---|---|
| | | X | Y |
| නිමැවුම් | 5,200 | 2,200 | 1,800 |
| එකලස් | 1,450 | 1,500 | 3,000 |
| ගබඩාව | 3,000 | - | - |
| | | | |
| වර්ෂය තුල නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත ඒකක ප්‍රමාණය | | 10,000 | 5,000 |

I. ගබඩාව, එකලස් හා නිමවුම් අතර පිළිවෙලින් දෙකට එක අනුපාතයට සේවා සපයන බව ඇස්තමේන්තු කර ඇත.

II. නිෂ්පාදන දෙපාර්තමේන්තු භාවිතා කිරීමට අපේක්ෂිත යන්ත්‍ර සහ ශ්‍රම පැය පහත පරිදි වේ.

| | නිමවුම් | එකලස් |
|---|---|---|
| යන්ත්‍ර පැය | 20,000 | 6,000 |
| ඍජු ශ්‍රම පැය | 2,000 | 10,000 |

III. නිමැවුම් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය මතද එකලස් දෙපාර්තමේන්තුව ශ්‍රම පැය මතද පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරේ.

**IV.** X භාණ්ඩය නිපදවීම සඳහා එකලස් හා නිමැවුම් මධ්‍යස්ථාන පිළිවෙලින් ශ්‍රම පැය දෙකක් හා යන්ත්‍ර පැයක් වැය කරනු ලබයි.

**අවශ්‍ය වන්නේ,**

1. ගබඩා දෙපාර්තමේන්තුවේ පොදු කාර්ය එකලස් හා නිමවුම් දෙපාර්තමේන්තු අතර නැවත විභාජනය කිරීම.
2. නිමවුම් හා එකලස් දෙපාර්තමේන්තු සඳහා වෙන වෙනම පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කිරීම.
3. X භාණ්ඩයේ ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම.

**(ආ)** දේවක සහ නිර්මල, Questionbank.lk නමින් උපදේශන ආයතනයක් පවත්වාගෙන යන අතර ඔවුන් ව්‍යාපාරයේ උපදේශකවරුන් ලෙස සේවය කරයි. කළමනාකරණ සහායක ලෙස කටයුතු කරනු ලබන්නේ මලින්ද වේ.

I. 2024 මාර්තු මාසය සඳහා ඔවුන් තිදෙනා සඳහා ව්‍යාපාරය දැරූ දළ වැටුප් වටිනාකම පහත දැක්වේ.

| | රු. |
|---|---|
| දේවක | 150,000 |
| නිර්මල | 140,000 |
| මලින්ද | 50,000 |

II. 2024 මාර්තු මාසය තුල දේවක පැය 10 ක් ද නිර්මල පැය 12 ක් ද මලින්ද පැය 40 ක් අතිකාල සේවයේ යෙදී ඇත. පැයක් සඳහා අතිකාල ගෙවීම් පහත පරිදි වේ.

- උපදේශකවරුන් සඳහා රු. 1,000
- කලමනාකරණ සහයක සඳහා රු. 200

III. ඉහත තිදෙනා සඳහා ව්‍යාපාරය විසින් කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල් දායකය (EPF) සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල් දායකත්වය (ETF) දළ වැටුප් මත පිළිවෙලින් 15% හා 3% කි.සේවකයින් විසින් සේවක අර්ථසාධක අරමුදලට දළ වේතනයෙන් 10% ක් දායක විය යුතුය.

IV. සෑම මසකම උපදේශකයින් දෙදෙනා රු. 1,000 බැගින් ද කළමනාකරණ සහයක රු. 500 බැගින් ද මරණාධාර අරමුදලට දායක විය යුතුයි.

V. සෑම මාසයක් සඳහාම වැටුප්, EPF සහ ETF දායකයන් ගෙවනු ලබන්නේ ඊළඟ මාසයේ දහවන දින දීය.

VI. 2024.03.31 දිනට උපචිතව තිබූ දෑ පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| වේතන | 288,000 |
| EPF | 80,000 |
| ETF | 9,600 |

**අවශ්‍ය වන්නේ,**

1. 2024 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛනය (පහත සඳහන් ආකෘතියට අනුව)

| සේවකයාගේ නම | ඉපැයීම | | අඩු කිරීම් | | | ශුද්ධ වැටුප | සේවා දායකයන් | |
|---|---|---|---|---|---|---|---|---|
| | මූලික වැටුප | අතිකාල දීමනා | දළ වැටුප | EPF | මරණාධාර | | EPF | ETF |
| | | | | | | | | |

2. 2024 මාර්තු මාසය සඳහා පහත සඳහන් ගිණුම

- වැටුප් පාලන ගිණුම

- උපචිත වැටුප් ගිණුම
- උපචිත EPF ගිණුම

3. 2024 මාර්තු මාසය සඳහා සේවකයින්ට අදාළ මුළු වියදම (එක් එක් වියදම් අයිතමය වෙන් වෙන්ව දැක්විය යුතුය)

**(3) (අ)** සී/ සහිත ACCA සමාගමේ 2024 ජනවාරි මාසය තුළ දී සිදු කරන ලද ගනුදෙනු පහත දක්වා ඇත.

| දිනය | දේපල පිරියත හා උපකරණ | තොග | වෙළඳ ලැබිය යුතු දෑ | බැංකු | | හිමිකම | ජංගම නො. වගකීම් | වෙළඳ ගෙවිය යුතු දෑ | වෙළඳ නොවන ගෙවිය යුතු දෑ |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2024.01.01 | 8,000 | 2,000 | 1,000 | 1,500 | = | 11,000 | 1,000 | 400 | 100 |
| 01.02 | 1,000 | | | | = | 1,000 | | | |
| 01.05 | | | (350) | 300 | = | (50) | | | |
| 01.08 | | (400) | 800 | | = | 400 | | | |
| 01.10 | | | | (200) | = | (50) | (150) | | |
| 01.12 | | | | (100) | = | | | | (100) |
| 01.15 | (300) | | | | = | (300) | | | |
| 01.18 | | | (30) | | = | (30) | | | |
| 01.20 | | | | (200) | = | (200) | | | |
| 01.22 | | | | (160) | = | 40 | | (200) | |
| 01.25 | | | | 2,500 | = | 2,500 | | | |
| | 8,700 | 1,600 | 1,420 | 3,640 | = | 14,310 | 850 | 200 | 0 |

- ජනවාරි 02, 20 සහ 25 යන දිනයන්ට අදාළ ගනුදෙනු හිමිකමට සෘජුව බලපායි.

**අවශ්‍ය වන්නේ,**

1. ඉහත එක් එක් දිනයන්හි දි සිදුවී ඇතැයි සැලකිය හැකි වඩාත් සුදුසු ගනුදෙනු වටිනාකම් සහිතව දක්වන්න.
2. 2024.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය
3. 2024.01.31 දිනට මූල්‍ය තත්ත ප්‍රකාශය

**(ආ)** සී/ස සෙත්සුව ආයතනයට අදාළව පහත තොරතුරු ඔබට සපයා ඇත. අවසන් මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී ගණකාධිකාරිවරයා විසින් පහත තොරතුරු අනාවරණය කර ඇත.

I. 2024.03.01 දිනට උපලබ්ධි නොවූ චෙක්පත් හා ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම් පිලිවෙලින් රු. 100,000 ක් සහ රු. 50,000 ක් වේ.

II. 2024 මාර්තු මාසයේ සිදු වූ පහත ගනුදෙනු බැංකු ප්‍රකාශයේ පමණක් සඳහන් විය.

- බැංකු අගරු ගාස්තු රු. 4,000
- වෙළඳ ලැබිය යුතු දෑ මත සෘජු ප්‍රේෂණ රු. 15,000 කි.
- මාර්ගස්ථ මෝටර් රථය විනාශ වීම මත ලද රක්ෂණ වන්දිය රු. 150,000 කි.( සම්පූර්ණ අලාභය වියදමක් සේ සලකා ගිණුම්ගත කොට තිබිණ.)
- ස්ථාවර නියෝග මත ගෙවූ බැංකු ණය වාරිකය රු. 5,000

III. 2024.03.31 දිනට මුදල් ගිණුමේ ශේෂය රු. 800,000 ක් වූ අතර ඉහත මග හැරීම් සටහන් කිරීමට පෙර 2024.03.31 න් අවසන් වර්ෂයේ කෙටුම්පත් ශුද්ධ ලාභය රු. 75,000 කි.

**අවශ්‍ය වන්නේ,**

1. 2024.03.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය
2. 2024.03.31 න් අවසන් වර්ෂයේ නිවැරදි ලාභය දැක්වෙන ප්‍රකාශනය

**(4) (අ)** ලාභලාභ සම සමව බෙදා ගන්නා අනිල් සහ රනිල් උපදේශන සේවා සපයන ව්‍යාපාරයක හවුල්කරුවන් වූහ. 2023.04.01 දින ජනක හවුල්කරුවකු ලෙස බඳවා ගන්නා ලදී. සංශෝධනය කරන ලද හවුල් ව්‍යාපාර ගිවිසුම පහත පරිදි වේ.

- අනිල්, රනිල් සහ ජනක පිළිවෙලින් ලාභාලාභ 3: 2: 1 අනුපාතයට බෙදාගනු ලබයි.
- හවුල් ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගන්නා අතර කීර්තිනාමයට අදාළ සියලු ගැළපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුලින් සටහන් කරයි.
- හවුල්කරුවන් වර්ෂ අවසාන ප්‍රාග්ධන ශේෂ මත 5% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.
- සෑම හවුල්කරුවෙකුටම රු. 30,000 බැගින් මාසික වේතනයක් හිමි වේ.
- හවුල් ව්‍යාපාරයකට ලබා දෙන ණය සඳහා හවුල්කරුවන් වාර්ෂිකව 10% ක පොලියකට හිමිකම් ලබයි.

2024.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

**රු.000**

| විස්තර | හර | බැර |
|---|---|---|
| උපදේශන ආදායම් | | 9,500 |
| උපදේශන වියදම් | 4,200 | |
| මෙහෙයුම් වියදම් | 1,200 | |
| අනිල්ට ගෙවූ වේතන | 200 | |
| රනිල්ට ගෙවූ වේතන | 150 | |
| 2023.10.01 දින ජනක ලබා දුන් ණය | | 1,800 |
| ජනකට ගෙවූ ණය පොලී | 60 | |
| දේපළ පිරියත සහ උපකරණ - 2023.04.01 දිනට | 15,000 | |
| සම්මුච්චිත ක්ෂය වෙන් කිරීම - දේපළ පිරියත සහ උපකරණ | | 5,500 |
| වෙනත් ආදායම් | | 245 |
| බැංකුවේ ඇති මුදල් | 755 | |
| 2023.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම - අනිල් | | 1,800 |
| රනිල් | | 1,900 |
| 2023.04.01 දිනට ජංගම ගිණුම - අනිල් | | 200 |
| රනිල් | | 160 |
| ජනක රැගෙන ආ මුදල | | 500 |
| බොල් ණය | 40 | |
| | 21,605 | 21,605 |

**අතිරේක තොරතුරු,**

I. ගිණුම් වර්ෂය ආරම්භයේ දී ජනක ව්‍යාපාරයට බඳවා ගැනීමේ දී ප්‍රාග්ධනය ලෙස මෝටර් රථයක් සහ මුදල් රැගෙන එන ලදී. එම මෝටර් රථයේ වටිනාකම රු. 1,200,000 කි. ඔහු රැගෙන ආ මුදල පමණක් සටහන් කර ඇත.

II. ව්‍යාපාරයේ සියළුම ක්ෂය කල හැකි දේපල පිරියත හා උපකරණ වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරනු ලබයි.

III. ජනක ව්‍යාපාරයේ හවුල්කරුවෙකු ලෙස බඳවාගැනීමේ දී ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1,500,000 ක් ලෙස අගය කරන ලදී.

IV. 2024.01.01 දින සේවා දායකයෙකු සමඟ සේවා සැපයීමට ගිවිසුමකට එළඹුණු අතර ලද මුළු මුදලම සේවා ආදායම් ලෙස සටහන් කර ඇත. ඔහුට නිකුත්කරන ලද ඉන්වොයිසි පත පහත දැක්වේ.

**ඉන්වොයිසි පත**

| | |
|---|---|
| අදාල උපදේශන ආදායම | රු. 300,000 |
| (-) වට්ටම් | රු. (20,000) |
| | 280,000 |
| මුදල් ලැබීම | රු. 350,000 |
| ඉදිරියට ලද සේවා ආදායම් | රු. 70,000 |

V. බැංකු ප්‍රකාශය ලැබීමෙන් පසු පහත තොරතුරු අනාවරණය කරගැනීමට හැකිවිය.

- ගණුදෙනුකරුවන් විසින් රු. 260,000 ක මුදලක් ඍජුවම ව්‍යාපාරයේ බැංකු ගිණුමේ තැන්පත් කර තිබු අතර ඒ පිළිබඳ කිසිදු සටහනක් තබා නොමැත. මෙම මුදල් වලින් රු. 60,000 ක මුදලක් ලැබී ඇත්තේ පෙර ගිණුම් වර්ෂයේ බොල්ණය ලෙස කපාහල මුදලයි.
- බැංකු ගාස්තු සහ චෙක්පොත් ගාස්තු වශයෙන් රු. 20,000 ක් හා රු. 15,000 ක් පිළිවෙලින් අයකර තිබුණි.

**අවශ්‍ය වන්නේ,**

1. 2024.03.31 න් අවසන් වර්ෂයේ හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ ප්‍රකාශය හා ලාභ විසර්ජන ගිණුම
2. 2024.03.31 අවසන් වසරේ හවුල්කරුවන් ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම

**(ආ)** තිළිණිගේ ව්‍යාපාරයේ 2024.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම තුලනය නොවු හෙයින් වෙනස අවිනිශ්චිත ගිණුමක ලියා තබන ලදී. එදිනට කෙටුම්පත් කරන ලද ආදායම් ප්‍රකාශනයට අනුව වර්ෂය සඳහා ලාභය රු. 650,000 ක් විය. පසුව ගිණුම් පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

I. විකුණුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව රු. 450,000 විකුණුම් ගිණුමට පිටපත් කර තිබුණේ රු. 540,000 ක් ලෙසය.

II. ණයගැතියෙකුගේ අය වියයුතු රු. 14,000 ක් හානිකරණ අලාභ (බොල් ණය) ලෙස කපා හැර ඇතත් ඒ පිළිබඳ පොදු ලෙජරයේ සටහනක් තබා නැත.

III. 2023.10.01 දින මිලදී ගත් රු. 60,000 ක කාර්යාල උපකරණ කාර්යාල වියදම් ගිණුමට හර කර ඇත. ව්‍යාපාරය සියලු දේපල පිරියත උපකරණ පිරිවැය මත 10% බැගින් ක්ෂය කරනු ලැබේ.

IV. බැංකු පොලී සඳහා ගෙවු පොලි ලද පොලි ගිණුමට බැර කර ඇත.

V. ඉදිරි වර්ෂය සඳහා ලද විකුණුම් අත්තිකාරම් රු. 40,000 විකිණුම් ගිණුමට බැර කර ඇත.

VI. මෝටර් රථ ගිණුමේ ශේෂය වු රු. 4,000,000 ක් ශේෂ පිරික්සුමේ සටහන් කර ඇත්තේ රු. 400,000 ක් ලෙසය.

VII. රු. 25,000 ක භාණ්ඩ ණයට ගැනුම් පිළිබඳ ඉන්වොයිසිය සම්පූර්ණයෙන් මගහැරී ඇත.

VIII. මුදල් ගෙවීම් ජර්නලයේ වට්ටම් තීරුවේ එකතුව වු රු. 30,000 ක් ලද වට්ටම් ගිණුමට හර කර ණයහිමි පාලන ගිණුම බැර කර ඇත.

IX. 2024.03.31 දිනට තොගවල ශුද්ධ උපලබ්ධි අගය පිරිවැයට වඩා රු. 35,000 ක් අඩුවිය. එසේ නමුත් වර්ෂයේ ලාභය ගණනයේදී අවසන් තොගය පිරිවැයට තක්සේරු කර ඇත.

**අවශ්‍ය වන්නේ,**

1. ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන්
2. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ශුද්ධ ලාභය
3. ඉහත (II), (III), (V) හා (IX) යන වැරදි හා මගහැරීම් වලට අදාල ගිණුම්කරණ සංකල්ප

(5) (අ) සීමිත Enrich Business School පොදු සමාගමේ 2024.03.31 සහ 2023.03.31 දිනවලට සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දී ඇත.

| | 2024.03.31 දිනට (රු. 000) | 2023.03.31 දිනට (රු. 000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට | 19,600 | 13,100 |
| දේපළ, පිරියත සහ උපකරණ - සමුච්චිත ක්ෂය | (3,800) | (2,800) |
| තොගය | 1,500 | 1,400 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 1,600 | 1,800 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 400 | 500 |
| **මුළු වත්කම්** | 19,300 | 14,000 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන | 9,500 | 8,000 |
| රඳවාගත් ඉපැයුම් | 5,500 | 4,400 |
| ඉඩම් සඳහා ණය | 2,400 | - |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 1,750 | 1,600 |
| ණය මත ගෙවිය යුතු පොලී | 150 | |
| **මුළු වගකීම් සහ හිමිකම** | 19,300 | 14,000 |

අතිරේක තොරතුරු,

I. වර්ෂය තුළ දී පිරිවැය රු. 1,000, 000 ක් වූ කාර්යාල උපකරණ රු. 300,000 ක අත්පිට මුදලට විකුණන ලදී. විකුණූ දිනයේ දී මෙම උපකරණවල ධාරණ වටිනාකම රු. 600,000 ක් විය.

II. 2023.04.01 දින රු. 3,000,000 ක් වටිනා ඉඩමක් ණයට මිලදී ගන්නා ලදී. මෙම ණය මුදල රු. 600,000 බැගින් වූ සමාන වාරික 5 කින් ප්‍රවර්තන වර්ෂයේ සිට ගෙවිය යුතු වේ. තව ද මූලික ණය මුදල මත 5% ක වාර්ෂික පොලියක් ගෙවිය යුතු වේ.

III. වර්ෂය තුළ අත්පත් කරගත් අනෙකුත් සියලු දේපළ, පිරියත සහ උපකරණ අත්පිට මුදලට මිල දී ගෙන ඇත.

IV. වර්ෂය තුළ දී රු. 400,000 ක අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

V. වර්ෂය තුළ දී නිකුත් කළ සාමාන්‍ය කොටස්වල සංයුතිය පහත පරිදි වේ.

| නිකුතුවේ වේගය | වටිනාකම (රු. 000) |
|---|---|
| හිමිකම් කොටස් නිකුතුව | 1,000 |
| රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීත කරමින් නිකුත් කළ කොටස් | 500 |
| එකතුව | 1,500 |

කොටස්කරුවන් විසින් සියලු හිමිකම් ලබාගන්නා ලද අතර මුදල් නියමිත පරිදි ලැබිණි.

VI. සමාගම බදු නිදහස් කාලයක් තුළ ක්‍රියාත්මක වේ.

අවශ්‍ය වන්නේ,

1. LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත CINEC පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
2. කාර්යාල උපකරණ ඉවත් කිරීමේ ගිණුම

(ආ) 2021.04.01 දින පාසලක ආදි ශිෂ්‍යාවන්ගේ සංගමයක් ස්ථාපිත කරන ලදී. එහි ආරම්භක සාමාජිකාවන් රු. 500,000 ක් දායක වෙමින් යාවජීව සාමාජිකයින් ලෙස බැඳුනි. මෙම සංගමයේ පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| විස්තරය | 2024.03.31 දිනට (රු.) | 2023.03.31 දිනට (රු.) |
|---|---|---|
| ලැබිය යුතු සාමාජික මුදල් | 20,000 | 15,000 |
| කලින් ලද සාමාජික මුදල් | 30,000 | 25,000 |
| සමුච්චිත අරමුදල | ? | 200,000 |
| යාවජීව සාමාජික අරමුදල | ? | 400,000 |
| ටී ෂර්ට් තොගය - පිරිවැයට | 40,000 | - |
| ශාලාව වෙන්කිරීමේ අත්තිකාරම (සංගීත ප්‍රසංගය සඳහා) | - | 25,000 |
| සංගීත ප්‍රසංගයෙන් ලැබිය යුතු දෑ | ? | - |
| මුදල් | ? | 50,000 |

**අතිරේක තොරතුරු:**

I. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 500 කි. 2024.03.31 දිනට සාමාජිකයන් 600 දෙනෙකු (යාවජීව සාමාජිකයින් හැර) විය.

II. යාවජීව සාමාජික මුදල වසර 10 ක කාලයක් තුළ ආදායමෙහි හඳුනා ගැනේ.

III. සංගමයට අරමුදල් රැස්කිරීම සඳහා 2023.10.01 දින පවත්වන ලද සංගීත ප්‍රසංගයට පහත තොරතුරු අදාළ වේ.

| විස්තරය | මුදල් ලැබීම්/ ගෙවීම් (රු.000) |
|---|---|
| ප්‍රවේශපත්‍ර විකුණුම් | |
| එකක් රු. 1,000 බැගින් වන ප්‍රවේශ පත්‍ර 100 ක් | 100,000 |
| එකක් රු. 500 බැගින් වන ප්‍රවේශ පත්‍ර 400 ක් (80% ක් පමණ ලැබුණි) | 160,000 |
| ප්‍රසංගය සඳහා අනුග්‍රාහක දායකත්වයන් (75% පමණක් එකතු කර ඇත) | 375,000 |
| සංගීතඥයින්ට ගෙවීම් | |
| එක් අයෙකුට රු. 40,000 බැගින් ගායකයින් 5 දෙනෙකුට | 200,000 |
| සංගීත කණ්ඩායමට | 80,000 |
| ශාලා කුලිය | 50,000 |
| සංග්‍රහ වියදම් | 30,000 |

IV. සංගමය විසින් එකක් රු. 200 බැගින් ටී ෂර්ට් 500 ක් අත්පිට මුදලට මිලදී ගන්නා ලදී. මෙයින් 300 ක්, එකක් රු. 250 බැගින් සාමාජිකයින් අතරේ අත්පිට මුදලට විකුණන ලදී.

V. පරිපාලන සහායකට රු. 30,000 ක මාසික වැටුපක් ගෙවනු ලැබේ.

**අවශ්‍ය වන්නේ,**

1. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම
2. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ
   i. සාමාජික මුදල් ආදායම (යාවජීව සාමාජික මුදල් ආදායම ද ඇතුලුව)
   ii. සංගීත ප්‍රසංගයේ අතිරික්ත/ හිඟය
   iii. ටී ෂර්ට් විකිණීමෙන් ලද අතිරික්තය / හිඟය
3. 2024.03.31 දිනට පහත අයිතම වල ශේෂයන්
   i. සමුච්චිත අරමුදල
   ii. යාවජීව සාමාජික අරමුදල
   iii. සංගීත ප්‍රසංගයෙන් ලැබිය යුතු දෑ

**(6) (අ)** පහත සඳහන් තොරතුරු නිෂ්පාදන සමාගමක් විසින් භාවිතා කරන අමුද්‍රව්‍යයකට අදාළ වේ.

I. යළි ඇණවුම් ප්‍රමාණය ලෙස ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) වු කි.ග්‍රෑ. 12,000 භාවිතා කරයි.

II. ඇණවුමක් සිදු කිරීමේ පිරිවැය රු. 300 කි.

III. වාර්ෂික අමුද්‍රව්‍ය භාවිතය කි.ග්‍රෑ. 120,000 කි.

IV. 2024 ජූනි මාසය තුළ අමුද්‍රව්‍ය ලැබීම් හා නිකුත් කිරීම් සාරාංශය:

| දිනය | විස්තරය | ප්‍රමාණය කි.ග්‍රෑ | විශේෂ කරුණු |
|---|---|---|---|
| ජූනි 01 | ශේෂය | 5,000 | කි.ග්‍රෑ. 1 ක් රු. 15 බැගින් මැයි 10 දින මිලට ගත් කි.ග්‍රෑ. 1,000<br>කි.ග්‍රෑ. 1 ක් රු. 20 බැගින් මැයි 25 දින මිලට ගත් කි.ග්‍රෑ. 4,000 |
| ජූනි 08 | නිකුත් කිරීම | 2,000 | |
| ජූනි 10 | ලැබීම් | 12,000 | කි.ග්‍රෑ. 1 ක් රු. 25 බැගින් |
| ජූනි 30 | නිකුත් කිරීම් | 10,000 | |

V. 2024 ජූනි 30 දින භෞතික අමුද්‍රව්‍ය ශේෂය කි.ග්‍රෑ. 5,200 ක් විය.

VI. අමුද්‍රව්‍ය නිකුත් කිරීම් මිල කිරීම සඳහා, සමාගම පෙර ඇතුළු පෙර සිට (FIFO) ක්‍රමය භාවිතා කරයි.

**අවශ්‍ය වන්නේ,**

1. 2024 ජූනි මාසය තුළ දී නිකුත් කරන අමුද්‍රව්‍යවල මුළු පිරිවැය
2. ගබඩා ලෙජරයට අනුව 2024 ජූනි 30 දිනට ඇති අමුද්‍රව්‍ය වල පිරිවැය
3. 2024 ජූනි 30 දින භෞතික අමුද්‍රව්‍ය ශේෂය සහ ලෙජර ශේෂය අතර වෙනසට බලපෑ හැකි හේතු දෙකක්
4. EOQ ආකෘතියට අනුව මෙම අමුද්‍රව්‍යයේ තොග රඳවාගැනීමේ වාර්ෂික පිරිවැය

**(ආ)** දින 10 ක් පුරා පැවැත්වීමට නියමිත වෙළෙඳ ප්‍රදර්ශනයේදී නව භාණ්ඩයක් හඳුන්වා දීමට සහ විකිණීමට සමාගමක් භාරගෙන ඇත. මෙම භාණ්ඩය එහි සැපයුම්කරු විසින් ඒකකයක් රු. 4,500 ක පිරිවැයකට සමාගමට සපයනු ලබයි. මෙම භාණ්ඩ ඒකකයක් රු. 8,000 ක මිලකට විකිණීමට අපේක්ෂා කළත්, මෙම මිලෙන් 20% ක වට්ටමක් ප්‍රදර්ශනයේදී දෙනු ලැබේ. අපේක්ෂිත පිරිවැය පහත පරිදි වේ.

| විස්තරය | රු. |
|---|---|
| ප්‍රදර්ශන කුටිය සඳහා කුලිය | 40,000 |
| අත්පත්‍රිකා මුද්‍රණය කිරීමේ පිරිවැය | 5,000 |
| ප්‍රදර්ශන කුටියේ කළමනාකරුට දීමනාව | 25,000 |
| විකුණුම් සහකරුවෙකු සඳහා දීමනා (එක් දිනකට) | 1,000 |
| විකුණන සෑම භාණ්ඩ ඒකකයක් සමඟ ම තෑගී කරන කෝප්පයේ මිල | 100 |

- විකුණුම් සහකරුවන් දෙදෙනෙකු මෙම කාල සීමාව සඳහා බඳවා ගනු ලැබේ.

**අවශ්‍ය වන්නේ,**

1. මෙම කාර්යයේ මුළු ස්ථාවර පිරිවැය
2. මෙම කාර්යයේ මුළු පිරිවැය ආවරණය කිරීමට විකිණිය යුතු ඒකක ගණන
3. රු. 270,000 ක ලාභයක් ඉපයීම සඳහා විකිණිය යුතු ඒකක ගණන
4. විකුණන සෑම ඒකකයක් සඳහා ම විකුණුම් මිල මත 10% ක කොමිස් මුදලක් කළමණාකරුට ගෙවනු ලබන විට විකුණුම් ඒකක 100 ක දී උපයන ලාභය (කළමණාකරුට ගෙවන දීමනාවට අමතරව)

# Suggested Answers – Paper I

| | | | | | |
|---|---|---|---|---|---|
| **(1)** | **1** | **(2)** | **5** | **(3)** | **5** |
| **(4)** | **5** | **(5)** | **1** | **(6)** | **1** |
| **(7)** | **5** | **(8)** | **3** | **(9)** | **4** |
| **(10)** | **1** | **(11)** | **3** | **(12)** | **1** |
| **(13)** | **4** | **(14)** | **3** | **(15)** | **5** |
| **(16)** | **1** | **(17)** | **1** | **(18)** | **2** |
| **(19)** | **2** | **(20)** | **5** | **(21)** | **5** |
| **(22)** | **3** | **(23)** | **5** | **(24)** | **1** |
| **(25)** | **2** | **(26)** | **4** | **(27)** | **5** |
| **(28)** | **1** | **(29)** | **2** | **(30)** | **1** |

**(31)** රු. 900

**(32)** රු. 377,350

**(33)**

| | මූලාශ්‍ර ලේඛන | මූලික පොත |
|---|---|---|
| 1 | ගැණුම් ඉන්වොයිසිය | ගැණුම් ජර්නලය |
| 2 | ගෙවීම් වව්චරය | මුදල් පොත |
| 3 | ජර්නල් වව්චරය | පොදු ජර්නලය |
| 4 | ජර්නල් වව්චරය | පොදු ජර්නලය |

**(34)** (අ) රු. 1,900,000

(ආ) රු. 14,900,000

**(35)** තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්
නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්
බැංකුව අතින් සිදු වී ඇති වැරදි

**(36)** (අ) ණයහිමි (හර) 18,000
ගැණුම් 18,000

(ආ) ලාභයට ඇති බලපෑම රු. (18,000)

**(37)** A. අසත්‍යයි
B. සත්‍යයි
C. සත්‍යයි
D. සත්‍යයි

**(38)**

1. ස්ථාවර වත්කම් ඓතිහාසික පදනම මත වාර්තා කල නොහැකි වීම.
2. ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට පදනමක් නොමැති නිසා ක්ෂය වෙන් නොවීම.
3. වත්කම් ස්ථාවර හා ජංගම ලෙස වර්ග කල නොහැකි වීම.

4. වගකීම් දිගුකාලීන හා ජංගම ලෙස වර්ග කල නොහැකි වීම.

**(39)**

A. සත්‍යයි
B. අසත්‍යයි
C. සත්‍යයි
D. සත්‍යයි

**(40)**

1. තිබූ තත්ත්වයන්ට සාපේක්ෂව වන තත්ත්වයන් වෙනස් වීම.
2. අලුත් තොරතුරු හෝ අත්දැකීම් ඇතිවීම.

**(41)**

පිරිවැය රු. 1,260,000
ශු. උ.ල. අගය රු. 1, 210,000

**(42)** (අ) රු. 174,000
(ආ) රු. 6,000

**(43)** (අ) රු. 1,980,000
(ආ) ලාභය රු. 300,000 කින් අඩු වේ

**(44)**

**සමාගමට**

1. කොටස් නිකුත් කිරීමට පිරිවැයක් වැය නොවීම.
2. ලාබ බෙදාහැරීමට සමාන වුවත් කාරක ප්‍රාග්ධනයට බලපෑම් ඇති නොවීම.

**කොටස් හිමියන්ට**

1. කොටස් නිකුත් කිරීමට පිරිවැයක් වැය නොවීම.
2. ලාබ බෙදාහැරීමට සමාන වුවත් කාරක ප්‍රාග්ධනයට බලපෑම් ඇති නොවීම

**(45)**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | කොටස් නිකුත් කිරීමේ ගි. | හර | 5,000,000 | |
| | මුදල් ගි. | බැර | | 5,000,000 |
| (ආ) | කොටස් නිකුති කිරීමේ ගි. | හර | 10,000,000 | |
| | ප්‍රකාශ කල ප්‍රාග්ධනය | බැර | | 10,000,000 |

**(46)**

| | අවස්ථාව | ණය - හිමිකම් අනුපාතය මත බලපෑම |
|---|---|---|
| 1. | වත්කම් ඉහළ අගයකට ප්‍රත්‍යාගණනය කිරීම | අඩුවේ |
| 2. | දිගු කාලීන ණයක් ලබා ගැනීම | වැඩිවේ |
| 3. | ණයට භාණ්ඩ මිල දී ගැනිම | වෙනස් නොවේ |
| 4. | නව කොටස් නිකුතුවක් සිදු කිරීම | අඩුවේ |

**(47)** රු. 249,000

**(48)**

- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විකල්ප ගිණුම්කරණ ප්‍රතිපත්තා හා පදනම් යොදාගත හැකි නිසා සමාන ව්‍යාපාර දෙකක් වුවද සංසන්දනය කිරීමට බාධා පැමිණේ.
- මූල්‍ය ප්‍රකාශනවලින් පෙන්වනුයේ මුදලින් මැනිය හැකි වත්කම් වුවද මුදලින් මැනිය නොහැකි වත්කම් ද ව්‍යාපාර වල තිබිය හැකි ය.

**(49)**

(අ) රු. 1,000 (ආ) ඒකක 4,000

**(50)** ඒකක 140 කි.

# Suggested Answers – II Paper

**සී/ස Enrich Business School පොදු සමාගමේ**
**2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ලාභා අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය (රු.000)**

| | |
|---|---|
| විකුණුම් | 16,800 |
| විකුණුම් පිරිවැය | (12,525) |
| දල ලාභය | 4,275 |
| වෙනත් ආදායම් | 65 |
| ආයතනික හා පරිපාලන | (5,010) |
| විකුණුම් හා බෙදාහැරීම් | (2,344.25) |
| මූල්‍ය විදයම් | (50) |
| වෙනත් | (210) |
| බදු පෙර ලාභය | (3,274.25) |
| ආදායම් බදු | (180) |
| කාලච්ඡේදය සඳහා ලාභය | 3,454.25 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | |
| මුළු විස්තීර්ණ ආදායම | (3,454.25) |

**සී/ස Enrich Business School පොදු සමාගමේ**
**2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය**

| | සා.කො. | | පොදු සංචිතය | | රඳවාගත් ලාභ |
|---|---|---|---|---|---|
| ඉ/ගෙ | 6,000 | | 1,700 | | 2,000 |
| වර්ෂයේ ලාභය | | | | | (3,454.25) |
| ප්‍රසාද නිකුතුව - 12,000 | 120 | | | | (120) |
| හිමිකම් නිකුතුව - 20,000 | 200 | | | | |
| පොදු සංචිතයට මාරු කි. | | | 150 | | (150) |
| | 6,320 | | 1,850 | - | (1,724.25) |

**සටහන 01**

| | |
|---|---|
| වෙනත් ආදායම් | |
| ලද වට්ටම් | 65,000 |

**සටහන 02**

| | |
|---|---|
| ආරම්භක තොගය | 1,200,000 |
| ගැණුම් | 11,645,000 |
| අවසන් තොගය | (320,000) |
| | 12,525,000 |

**සටහන 03**

| | |
|---|---|
| භාවිත අයිතිය ඇති වත්කම් | |
| පිරිවැය | 2,000,000 |
| ක්ෂය | (100,000) |
| | 1,900,000 |

**සටහන 04**

| | |
|---|---|
| ආදායම් බදු | |
| පෙර වර්. ඌන වෙ. | 180,000 |
| වර්. ආදායම් බදු | 0 |
| | 180,000 |

**සී/ස Enrich Business School පොදු සමාගමේ**
**2024.03.31 න් අවසන් දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | | |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ පිරියත උපකරණ | 2,110 | |
| භාවිත අයිතිය ඇති වත්කම් | 1,900 | 4,010 |
| | | |
| ජංගම වත්කම් | | |
| අවසන් තොගය | 230 | |
| ලැ/යු සේවක අත්තිකාරම් | 100 | |
| අයකර ගත යුතු රක්ෂණ ගෙවීම | 120 | |
| ඉදිරියට ගෙවූ රක්ෂණ (සේවක) | 90 | |
| ණයගැතියෝ | 3,291.75 | |
| මුදල් හා බැංකු | 2,990 | |
| ඉදිරියට ගෙවූ වියදම් | 120 | |
| ගැනුම් අත්තිකාරම් | 560 | 11,631.75 |
| | | 11,511.75 |
| | | |
| ප්‍රාග්ධනය හා වගකීම් | | |
| සා.කො. | 6,320 | |
| පොදු සංචිතය | 1,850 | |
| රඳවාගත් ඉපයුම්, | (1,724.25) | 6,445.75 |
| | | |
| ජංගම නොවන වගකීම් | | |
| කල්බදු ණය හිමියෝ | | 1,200 |
| | | |
| ජංගම වගකීම් | | |
| ණයහිමියෝ | 1,680 | |
| කල්බදු ණය හිමියෝ | 300 | |
| ගෙ/යු කල්බදු පොලිය | 50 | |
| වගකීම් සහතික වෙන් කිරීම | 336 | |
| විකුණුම් අත්තිකාරම් | 1,500 | 3,866 |
| | | |
| | | 11,511.75 |

**සටහන 05**

| | ඉඩම් | ගොඩනැගිලි | මෝටර් රථ | ලී බඩු |
|---|---|---|---|---|
| ඉ/ගෙ | 1,000 | 500 | 2,000 | 700 |
| ඉ/ගෙ | - | 250 | 1,000 | 200 |
| වාර්ෂික ක්ෂය | | 100 | 400 | 140 |
| | | 350 | 1,400 | 340 |
| | 1,000 | 150 | 600 | 360 |

**02. (අ)**

01.

| | එකලස් | නිමැවුම් | ගබඩාව |
|---|---|---|---|
| මුළු පොදු කාර්යය | 1,450 | 5,200 | 3,000 |
| සේවා පිරිවැය විභජනය | 2,000 | 1,000 | (3,000) |
| | 3,450 | 6,200 | 0 |

02. නිමැවුම් හා එකලස් දෙපාර්තමේන්තුවල පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

**එකලස් අංශය**

$= \frac{\text{මුළු පොදුකාර්යය පිරිවැය}}{\text{ශ්‍රම පැය}}$

$= \frac{3{,}450{,}000}{10{,}000}$

= 345

**නිමැවුම් අංශය**

$= \frac{\text{මුළු පොදුකාර්යය පිරිවැය}}{\text{යන්ත්‍ර පැය}}$

$= \frac{6{,}200{,}000}{20{,}000}$

= 310

03. X භාණ්ඩයේ ඒකකයක පිරිවැය = **<u>රු. 1,370</u>**

**සෘජු පිරිවැය**

| | |
|---|---|
| නිමැවුම් | රු. 2,200,000 |
| එකලස් | රු. 1,500,000 |
| | |
| මුළු සෘජු පිරිවැය | රු. 3,700,000 |
| ඒකක සෘජු පිරිවැය | රු. 3,700,000/10,000 |
| | රු. 370 |

**ඒකක පොදුකාර්ය පිරිවැය**

| | | |
|---|---|---|
| නිමැවුම් | රු. 310 * 1 = 310 | |
| එකලස් | රු. 345 * 2 =690 | |
| | | රු. 1,000 |
| | | |
| X භාණ්ඩයේ ඒකකයක පිරිවැය | රු. 1,370 | |

(ආ) (01)

| සේවකයාගේ නම | ඉපැයීම් | | | අඩු කිරීම් | | ශුද්ධ වැටුප | සේවා දායකයන් | |
|---|---|---|---|---|---|---|---|---|
| | මූලික වැටුප | අතිකාල දීමනා | දළ වැටුප | EPF | මරණාධාර | | EPF | ETF |
| දේවක | 140,000 | 10,000 | 150,000 | 15,000 | 1,000 | 134,000 | 25,500 | 4,500 |
| නිර්මල | 128,000 | 12,000 | 140,000 | 14,000 | 1,000 | 125,000 | 21,000 | 4,200 |
| මලිත් | 42,000 | 8,000 | 50,000 | 5,000 | 500 | 44,500 | 7,500 | 1,500 |
| | 310,000 | 30,000 | 340,000 | 34,000 | 2,500 | 303,500 | 51,000 | 10,200 |

02.

වේතන පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| EPF | 34,000 | මූලික වැටුප | 310,000 |
| මරණාධාර | 2,500 | අතිකාල | 30,000 |
| උපචිත වේ. | 303,500 | | |
| | 340,000 | | 340,000 |

උපචිත වේතන ගි.

| | | | |
|---|---|---|---|
| මුදල් | 288,000 | ඉ/ගෙ | 288,000 |
| | | වේතන පාල. | 303,500 |
| ප/ගෙ | 303,500 | | |
| | 591,500 | | 591,500 |

උපචිත EPF ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 80,000 | ඉ/ගෙ | 80,000 |
| | | සේවක | 34,000 |
| | | සේවා | 51,000 |
| ප/ගෙ | 85,000 | | |
| | 165,000 | | 165,000 |

03.

| | |
|---|---|
| දළ වැටුප | 340,000 |
| EPF (සේවා) | 51,000 |
| ETF (සේවා) | 10,200 |
| | 401,200 |

**03. (අ) 01.**

| **දිනය** | **ගනුදෙනුව** |
|---|---|
| 2022.01.02 | - අමතර ප්‍රාග්ධනය රු. 1,000 යොදා මෝටර් රථයක් මිලට ගැනීම. |
| 2022.01.05 | - රු. 50 ක වට්ටමක් ලබා දෙමින් ණයගැතියෙකුගෙන් මුදල් එකතු කර ගැනීම. |
| 2022.01.08 | - පිරිවැය රු. 400 ක තොගයක් රු. 800 කට ණයට විකිණීම. |
| 2022.01.10 | - රු. 50 ක පොලියක් සහිත රු. 200 ක ණය වාරිකය ගෙවීම. |
| 2022.01.12 | - උපචිත වූ වැටුප් රු. 100 ක් ගෙවා දැමීම. |
| 2022.01.15 | - රු. 300 ක දේපල පිරියත උපකරණ ක්ෂය සටහන් කිරීම. |
| 2022.01.18 | - රු. 30 ක ණයගැති වටිනාකමක් බොල්ණය ලෙස කපා හැරීම. |
| 2022.01.20 | - රු. 200 ක ගැනිලි අයිතිකරු සිදු කිරීම. |
| 2022.01.22 | - රු. 40 ක වට්ටමක් සහිතව රු. 200 ක ණයහිමි වටිනාකමක් සමතයකට පත් කිරීම. |
| 2022.01.25 | - අමතර ප්‍රාග්ධනය රු. 2,500 ක් දැමීම. |

02.

**ආදායම් ප්‍රකාශය**

| | | |
|---|---|---|
| විකුණුම් | | 800 |
| ආරම්භක තොග | 2,000 | |
| අවසන් තොගය | (1,600) | (400) |

| | | |
|---|---|---|
| දල ලාභය | | 400 |
| වියදම් | | |
| දුන් වට්ටම් | 50 | |
| පොලී | 50 | |
| ක්ෂය | 300 | |
| බොල් ණය | 30 | |
| ලද වට්ටම් | (40) | 390 |
| ශුද්ධ ලාභය | | 10 |

03.

**මූල්‍ය තත්ව ප්‍රකාශය**

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 11,000 | ජංගම නොවන වත්කම් | |
| අමතර ප්‍රාග්ධනය | 3,500 | දේපල පිරියත උපක. | 8,700 |
| ගැනිලි | (200) | | |
| ප්‍රාග්ධනය | 14,300 | | |
| ශුද්ධ ලාභය | 10 | | |
| | | ජංගම වත්කම් | |
| ජංගම නොවන වගකීම් | | තොගය | 1,600 |
| බැංකු ණය | 850 | වෙළඳ ලැ/යුතු | 1,420 |
| | | බැංකු | 3,640 |
| ජංගම වගකීම් | | | |
| වෙළඳ ගෙ/යුතු | 200 | | |
| වෙළඳ නොවන ගෙ/යුතු | | | |
| | 15,360 | | 15,360 |

(ආ).

01.

**සංශෝධිත මුදල් පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ | 800,000 | අගරු ගාස්තු | 4,000 |
| සෘජු ප්‍රේෂණ | 15,000 | වාරික | 5,000 |
| වන්දි | 150,000 | | |
| | | ප/ගෙ | 966,000 |
| | 975,000 | | 975,000 |

**බැංකු සැසඳුම් ප්‍රකාශනය**

| | |
|---|---|
| සංශෝධිත මුදල් පොතේ ශේෂය | 966,000 |
| (+) ඉදිරිපත් නොවූ චෙක්පත් | 50,000 |
| (-) උපලබ්ධි නොවූ චෙක් | (100,000) |
| බැංකු ප්‍රකාශය අනුව ශේෂය | 916,000 |

02.

**ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශනය**

| | |
|---|---:|
| ගණනය කර ඇති ලාභය | 75,000 |
| (+) වන්දි | 150,000 |
| (-) අගරු ගාස්තු | (4,000) |
| නිවැරදි ලාභය | 221,000 |

**04. (අ).**

01.

**ලාභාලාභ හා විසර්ජන ප්‍රකාශනය** **(රු.000)**

| | | | |
|---|---|---:|---:|
| ආදායම් | | | |
| උපදේශන ආදායම් | | 9,430 | |
| වෙනත් ආදායම් | | 245 | |
| | | | 9,675 |
| වියදම් | | | |
| ක්ෂය (1,500 +120) | | 1,620 | |
| බැංකු ගාස්තු | | 20 | |
| චෙක්පත් ගාස්තු | | 15 | |
| උපදේශන වියදම් | | 4,200 | |
| මෙහෙයුම් වියදම් | | 1,200 | |
| ණයපොලී (ජනක) | | 90 | |
| ශුද්ධ බොල්ණය (40-60) | | (20) | (7,125) |
| ශුද්ධ ලාභය | | | 2,550 |
| (-) ප්‍රාග්ධන පොලී | - A | 90 | |
| | - R | 107.5 | |
| | - J | 72.5 | (270) |
| (-) හවුල් වේතන | - A | 360 | |
| | R | 360 | |
| | J | 360 | (1,080) |
| (-)ලාභ කොටස් | - A | 600 | |
| | - R | 400 | |
| | - J | 200 | (1,200) |

02.

**ප්‍රාග්ධන ගිණුම** **රු.000**

| | A | R | J | | A | R | J |
|---|---:|---:|---:|---|---:|---:|---:|
| | | | | ඉ/ගෙ/ශේ | 1,800 | 1,900 | |
| කීර්ති නාමය | 750 | 500 | 250 | ජනක ගෙනා මෝ/ර | | | 1,200 |
| | | | | ජනක ගෙනා මුදල් | | | 500 |
| ප/ගෙ/ශේ | 1,800 | 2,150 | 1,450 | කීර්ති නාමය | 750 | 750 | |
| | 2,550 | 2,650 | 1,700 | | 2,550 | 2,650 | 1,700 |

**ජංගම ගිණුම** **රු.000**

| | A | R | J | | A | R | J |
|---|---|---|---|---|---|---|---|
| ගෙවූ වේතන | 200 | 150 | | ඉ/ගෙ/ශේ | 200 | 160 | |
| ණයපොලී | | | | ප්‍රාග්ධන පොලී | 90 | 107.5 | 72.5 |
| | | | | වේතන | 360 | 360 | 360 |
| ප/ගෙ/ශේ | 1,050 | 877.5 | 547.5 | ලා/කොටස් | 600 | 400 | 200 |
| | 1,250 | 1,027.5 | 632.5 | | 1,250 | 1,027.5 | 632.5 |

(ආ).

01.

| | | |
|---|---|---|
| විකුණුම් ගිණුම හර | 90,000 | |
| අවිනිශ්චිත ගිණුම බැර | | 90,000 |
| බොල් ණය ගිණුම හර | 14,000 | |
| ණයගැති ගිණුම බැර | | 14,000 |
| කාර්යාල උපකරණ ගිණුම හර | 60,000 | |
| කාර්/උපකරණ වියදම් ගි. බැර | | 60,000 |
| ක්ෂය ගිණුම හර | 3,000 | |
| ක්ෂය වෙන් කිරීමේ ගිණුම බැර | | 3,000 |
| ලද පොලී ගිණුම හර | 10,000 | |
| බැංකු ණය පොලී ගිණුම හර | 10,000 | |
| අවිනිශ්චිත ගිණුම බැර | | 20,000 |
| විකුණුම් ගිණුම හර | 40,000 | |
| විකුණුම් අත්තිකාරම් ගිණුම බැර | | 40,000 |
| ------------------- | 3,600,000 | |
| අවිනිශ්චිත ගිණුම බැර | | 3,600,000 |
| ගැනුම් ගිණුම හර | 25,000 | |
| ණයහිමි ගිණුම බැර | | 25,000 |
| ණයහිමි පාලන ගිණුම හර | 60,000 | |
| ලද වට්ටම් ගිණුම බැර | | 60,000 |
| තොග කපා හැරීම් ගිණුම හර | 35,000 | |
| අවසන් තොග ගිණුම බැර | | 35,000 |

02.

ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශය

| | | |
|---|---|---|
| ගණනය කර ඇති ලාභය | | 650,000 |
| (+) එකතු කිරීම් | 60,000 | |
| | 60,000 | 120,000 |
| (-) අඩු කිරීම් | | |
| | 35,000 | |
| | 90,000 | |
| | 14,000 | |
| | 3,000 | |
| | 10,000 | |
| | 40,000 | |
| | 25,000 | (217,000) |
| නිවැරදි ලාභය | | 553,000 |

03.

2. ආරක්ෂණ සංකල්පය
3. ගැලපුම්/උපචිත සංකල්පය
5. කාලච්ඡේද සංකල්පය/උපලබ්ධි සංකල්පය
9. ආරක්ෂණ සංකල්පය

**5. (අ).**

01.

**සීමිත CINEC පොදු සමාගම**
**2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | | |
|---|---|---|
| | | (රු.'000) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| බදු පෙර ලාභය | | 2,000 |
| ක්ෂය | 1,400 | |
| පොලී වියදම් | 150 | |
| කාර්යාල උපකරණ විකිණීමේ අලාභය | 300 | 1,850 |
| මෙහෙයුම් තුළින් ලද මුදල් ප්‍රවාහ | | 3,850 |
| තොග වැඩිවීම | (100) | |
| වෙළඳ ලැබිය යුතු දෑ අඩුවීම | 200 | |
| වෙළඳ ගෙවිය යුතු දෑ වැඩිවීම | 150 | 250 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල්** | | 4,100 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| කාර්යාල උපකරණ විකිණීම | 300 | |
| දේපළ, පිරියත උපකරණ මිලට ගැනීම් | (4,500) | |
| ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් | | (4200) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| කොටස් නිකුත් කිරීමෙන් ලද මුදල් | 1,000 | |
| ඉඩම් ණය ගෙවීම | (600) | |
| ගෙවූ අතුරු ලාභාංශය | (400) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් | | - |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ අඩුවීම | | (100) |
| 2021.04.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ | | 500 |

| 2022.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ | | 400 |
|---|---|---|

02.

**කාර්යාල උපකරණ ඉවත් කිරීමේ ගිණුම**

| | | | |
|---|---|---|---|
| කාර්යාල උපකරණ | 1,000 | කාර්යාල උපකරණ සමුච්චිත ක්ෂය | 400 |
| | | මුදල් | 300 |
| | | ලාභලාභ | 300 |
| | 1,000 | | 1,000 |

(ආ).

01.

**මුදල් ගිණුම (රු. 000)**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 50,000 | ගායකයින් | 200,000 |
| ප්‍රවේශ පත්‍ර | 260,000 | සංගීත කණ්ඩායම් | 80,000 |
| අනුග්‍රාහක දීමනා | 375,000 | ශාලා කුලිය | 50,000 |
| සාමාජික මුදල් | 300,000 | සංග්‍රහ වියදම් | 30,000 |
| ටී ෂර්ට් විකුණුම් | 75,000 | ටී ෂර්ට් ගැනුම් | 100,000 |
| | | වැටුප් | 360,000 |
| | | ශේෂය ප/ගෙ | 240,000 |
| | 1,060 | | 1,060 |

02.

i. සාමාජික මුදල් ආදායම = රු. 350,000

ii. සංගීත ප්‍රසංගයේ අතිරික්තය = රු. 415,000

iii. ටී ෂර්ට් විකිණීමෙන් ලද අතිරික්තය = රු. 15,000

03.

i. 2022.03.31 දිනට සමුච්චිත අරමුදල = රු. 620,000

ii. යාවජීව සාමාජික මුදල = රු. 350,000

iii. සංගීත ප්‍රසංගයෙන් ලැබිය යුතු මුදල = රු. 165,000

**(06) (අ)**

01. නිකුත් කරන ලද අමුද්‍රව්‍ය වල මුළු පිරිවැය = රු. 270,000

02. අමුද්‍රව්‍ය වල පිරිවැය = රු. 125,000 (25 × 5,000)

03.

- භෞතික තොග ගණනයේදී අධිගණනයක් ඇති වීම.
- භාණ්ඩ ආපසු එවීම ලෙජරයේ සටහන් නොවීම.
- මිලදී ගත් භාණ්ඩ ලෙජරයේ ඇතුලත් කර නොතිබීම.
- වාර්තා කර නිකුත් කළ භාණ්ඩ ගබඩාවෙන් ඉවත් කර නොමැතිව අවසන් තොගයේ ඇතුළත්ව තිබීම.

04. රු. 3,000 හෝ ඒකකයට ශත 50 යි.

(ආ)

01. ස්ථාවර පිරිවැය රු. 90,000

පෙර වැඩ :

| | | රු. |
|---|---|---|
| ප්‍රදර්ශන කුටියේ කුලිය | = | 40,000 |
| අත්පත්‍රිකා මුද්‍රණ පිරිවැය | = | 5,000 |
| කළමනාකරුගේ දීමනාව | = | 25,000 |
| විකුණුම් සහකරුගේ දීමනාව | = | 20,000 |
| | | 90,000 |

02. ඒකක 50

$$\frac{90{,}000}{\frac{1{,}800}{(6{,}400 - 4{,}500 - 100)}}$$

03. ඒකක 200

පෙර වැඩ :

$$\frac{90{,}000 + 270{,}000}{1{,}800}$$

04. ලාභය රු. 26,000

පෙර වැඩ :

(100×1,160)-90,000)

6,400-(4,500+100+640)